**වර්ෂ 2022 ක් වූ නොවැම්බර් මස 08 වන දින පෙ.ව. 10.00 ට සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලද මතුගම ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව**

**සහභාගිත්වය :- පැමිණි සභිකවරු**

| | | |
|---|---|---|
| 01. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා | - | ගරු සභාපති |
| 02. ආර්.ඒ.ඩී.ලලිත් රණසිංහ මහතා | - | ගරු උප සභාපති |
| 03. මද්දුමගේ දොන් අතුල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. කසුන් හිරෝෂණ මුණසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 06. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 07. වික්‍රමආරච්චි කංකානම්ගේ කමිල් කුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 08. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 09. සෙම්බප්පෙරුම ආරච්චිගේ සිරිසේන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. කාලංචිදූරගේ මිත්‍රානන්ද මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. කේ.ප්‍රියංකා දමයන්ති ගුණවර්ධන මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 12. සංජේ එරංග කරවිට මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. ප්‍රේමරත්න නාකන්දල මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. සීතා ඩයස් ජයසිංහ මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 15. සූරියආරච්චිගේ සුජීව නිර්මාන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 16. පන්නිල විතානගේ පුෂ්පා නන්දනී මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 17. සම්පතා වඩුගේ තුසිතා ප්‍රියංගනී සිල්වා මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 18. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. තුඩුගලගේ දොන් රෝහිත මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. මද්දගේ හින්ටන් ගුණසිරි මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 21. ධම්මික නිර්මාල් විජේසිංහ මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 22. එච්.ඩී.සුරේෂ් දර්ශන ජයසේකර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 23. කේ.ඩබ්.නිලූකා දර්ශනී සිල්වා මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 24. අයි.එච්.ඩී.ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 25. කරුණාමුණි ප්‍රසාදික නදුන් ද සිල්වා මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 26. හෙලබගේ නිමාලක සුරංග විමලසූරිය මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |

**නොපැමිණි සභිකවරු**

| | | |
|---|---|---|
| 01. කේ.කේ.ඩී.ලලිත් නිශාන්ත කුලතුංග මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 02. කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 03. හෙවෙස්සගේ දොන් නාමල් ප්‍රදීප් විජේ කුමාර මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 04. ජේ.කේ.ඩී.පුබුදු මධුරංග ජයනෙත්ති මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 05. මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 06. දිසානායක සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 07. දෝන ලීලා මුණසිංහ මහත්මිය | - | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

**නිළධාරීන්**

| | | |
|---|---|---|
| 01. ඩබ්.ඒ.එම්.අයි.එස්.තෙන්නකෝන් මහත්මිය | - | ලේකම් |
| 02. එම්.කේ.ඩී.සී.අවන්ති මෙනවිය | - | සංවර්ධන නිලධාරී (සභා කටයුතු) |

මෙදින පෙ.ව.10.00 ට පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති මෙරිල් මුණසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මාසික මහ සභාව රැස්වූහ.පළමු ව ආගම සිහි කිරීමෙන් අනතුරු ව ගරු සභාපතිතුමා විසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයත්,නිලධාරීන් හා මාධ්‍යවේදීනුත් පිළිගැනීමෙන් අනතුරු ව න්‍යාය පත්‍රානුකූල ව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය.

**01. 2022 .10.11 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව සහා අනුමැතිය සලකා බැලීම :-**

ඉහත සභා වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතාගේ ස්ථිරත්වයෙන් පහත සංශෝධනයන්ට යටත් ව සභා සම්මත විය.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

මේ වාර්තාවේ අපේ මන්ත්‍රී මණ්ඩලයේ නම් සඳහන් වෙන ස්ථානයේ මන්ත්‍රීවරු තිස්හතර දෙනෙක්ගේ නම් සඳහන් වෙන්න ඕන ස්ථානයේ මන්ත්‍රීවරු තිස්තුන් දෙනෙකුගේ නම් විතරයි සඳහන් වෙන්නේ.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත අධිකාරි මන්ත්‍රීතුමාගේ නම පැමිණි සභිකවරුන්ගේ නම් ලැයිස්තුවේත් නැහැ,නොපැමිණි සභිකවරුන්ගේ නම් ලැයිස්තුවේත් නැහැ.අපට දැන ගන්න ඕන මේකට හේතුව මොකක් ද කියලා.ගිය වාර්තාවේ ආවා කියලා,නැතිනම් ආවේ නැහැ කියලා සඳහන් වෙන්න ඕන.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒ මන්ත්‍රීතුමා මාස තුනකට වඩා දැනුම් දීමක් නොකර මහ සභා රැස්වීම්වලට එන්නේ නැතුව ඉඳලා තියෙනවා.ලේකම්තුමිය ඒ පිළිබඳ ව දැනුම් දීලා මැතිවරණ කාර්යාලයට ලිපියක් යවලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ලීලා මුණසිංහ මහත්මිය පිළිබඳ ව දැන ගන්න ඕන.එතුමියගේ නිවාඩු අනුමත වුණු මාස 03 ඉවරයිනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

එතුමියගේ පාදයේ ආබාධයක් හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය බැවින් වට්ස්ඇප් පණිවිඩයක් මඟින් නිවාඩු අනුමත කර ගැනීම සඳහා මා වෙත ලිපියක් ඉදිරිපත් කරලා තියෙනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

වට්ස්ඇප් පණිවිඩයක් පිළි ගන්න පුළුවන් ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

සභාව තීරණය කරන්න ඕන ඒක.අපි අද තමයි මේක සභාවට දාලා එකඟතාවය අරගෙන කළුතරට යවන්නේ.කළුතරින් නිවාඩු අනුමත කළොත් අපට දෙන්න පුළුවන්.දැන් අපි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතාටත් ඒ වගේ නිවාඩු අනුමත කරලා ගත්තා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

ඊ ළඟට 13 වන පිටුවේ මම නෙට්බෝල් ක්‍රීඩාංගනයක් සහ වොලිබෝල් ක්‍රීඩාංගනයක් කියන ස්ථානයේ නෙට්බෝල් ක්‍රීඩාංගනයක් කියන එක වෙනුවට බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයක් කියලා වෙනස් වෙන්න ඕන. බැඩ්මින්ටන් ක්‍රීඩාංගනයක් තමයි ඒ අය හදලා තියෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

2022 ඔක්තොම්බර් මස මහ සභා වාර්තාවේ **48** පිටුවේ **6.1.25** යෝජනාව යටතේ මගේ අදහස් ප්‍රකාශ කිරීමේ දී ඉඩම් රෙජිස්ට්‍රාර් කර්යාල වෙතින් ලබා ගන්නා මුද්දර ගාස්තු තොරතුරු සඳහා එක් දේපළකට රු.100.00ක් වන සේ කාර්යාල මණ්ඩල දීමනාවක් ගෙවන නමුත් උසාවි දඩ අයකර ගැනීමේ දී කාර්ය මණ්ඩල දීමනාවක් නොගෙවන බැවින් එම **6.1.25** යෝජනාව යටතේ අදහස් ප්‍රකාශ කිරීම ඉහත පරිදි සංශෝධනය වෙන්න ඕන.

**02.** ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ නිවේදන :- නැත.

**03.** නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :-

01. කේ.කේ.ඩී.ලලිත් නිශාන්ත කුලතුංග මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
02. කත්‍රිආරච්චිගේ කාන්ත සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
03. මුල්ලේ විතානගේ ටෙක්ලා ෆ්ලෝරි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
04. දිසානායක සුදේශ් ලක්මාල් ජයවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. දෝන ලීලා මුණසිංහ මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී
06. ජේ.කේ.ඩී.පුබුදු මධුරංග ජයනෙත්ති මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**04.** සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම් සහ පැමිණිලි සභාගත කිරීම.

"මතුගම ගෝල්ඩ් මෙම්බ(ර්)ස් ස්පෝ(ර්)ට්ස් ක්ලබ්" ක්‍රීඩා සමාජය මඟින් එවන ලද ක්‍රීඩා සමාජ ශාලාවක් ඉදි කිරීම සඳහා ඉඩමක් ලබා ගැනීම සම්බන්ධයෙන් වන ඉල්ලීම් ලිපිය සභාගත කරන ලදී.

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න:- නැත.

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා :-

6.1.1 යටතේ 2018.04.10 දින මහ සභාවේ 5.1.8 යෝජනා සම්මුතිය අනුව ආවරණ අනුමැතියට යටත් ව මා වෙත පැවරී ඇති බලතල අනුව 2022.09.01 දින සිට 2022.09.31 දින දක්වා කරන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට යෝජනා කරන ලද අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා විසින් ස්ථිර කරන ලදී.එම යෝජනාව සියලු දෙනාගේ එකඟතාවයෙන් සංශෝධනයන්ට යටත් ව සභා සම්මත විය.

**<u>ගෙවීම් විස්තර-2022 සැප්තැම්බර් මාසය</u>**

| අනු අංකය | නම | වව්චර් අංකය | විස්තරය | මුදල |
|---|---|---|---|---|
| | **2022.09.01** | | | |
| 1 | පී.වී. දයාසිරි | 1 | පොදු වෙළඳපොල මාළු කඩය අලුත්වැඩියාව සඳහා වැලි කියුබ් 01 | 25000.00 |
| 2 | මුදල් භාරකරු | 2 | දැන්වීම් පුවරු අවසර පත් සඳහා ස්ටිකර් මුද්‍රණය කිරීමට අත්තිකාරම් ලබා ගැනීම | 18900.00 |
| 3 | සී/ස මතුගම විවිධ සේවා සමුපකාර සමිතිය | 3 | පොදු ගබඩාවට ඩීසල් ලීටර් 200 ක් ලබා ගැනීම (රු. 430.00 x 200 = 8600.00) | 86000.00 |
| 4 | ජගත් ටයිල් ස්ටෝර්ස් | 4 | පොදු වෙළඳපොල මාළු කඩය අලුත්වැඩියාව සඳහා 10' රයිනෝ සෙවිලි තහඩු 03 (රු. 5630.00 x 3 = 16890.00) | 16890.00 |
| | **2022.09.02** | | | |
| 5 | ඩබ්.ඒ. සුනිල් ප්‍රසන්න | 5 | ආදායම් පරීක්ෂක - 2022 ජුනි මස නිවාඩු දින වැටුප් | 5665.00 |
| 6 | ඩබ්.ඒ. සුනිල් ප්‍රසන්න | 6 | ආදායම් පරීක්ෂක - 2022 මැයි මස නිවාඩු දින වැටුප් | 5665.00 |
| | **2022.09.05** | | | |

| | | | | |
|---|---|---|---|---|
| 7 | ඩීසල් ඇන්ඩ් මෝටර් ඉංජිනියරින් | 7 | අතු කපන යන්ත්‍රය අලුත්වැඩියාව | 45440.10 |
| 8 | එම්.ඩී.ඊ. ඩීසල් ඉංජිනියරින් | 8 | 53 - 4621 කැබ් රථය අලුත්වැඩියාව | 45300.00 |
| 9 | මතුගම ඒජන්සිස් (පුද්) සමාගම | 9 | ඉන්ධන බිල්පත් - ඇමුණුම 01 | 88338.90 |
| 10 | එන්.එස්.ටී.එන්. විරාජිනි | 10 | සෞඛ්‍ය අංශයට ඩෙටෝල් සබන් හාපික් මිලට ගැනිම | 74750.00 |
| 11 | අජිත් පියරත්න මෝටර්ස් වර්ක්ස් | 11 | ZA - 6204 බොබ් කැට් යන්ත්‍රය අළුත්වැඩියාව | 25500.00 |
| 12 | සෝෆොස්ට් ප්‍රයිවට් ලිමිටඩ් | 12 | AAJ - 4210 ත්‍රී රෝද රථයට ක්ලච් ප්ලේට් සෙට් එකක් මිලදී ගැනීම | 3430.00 |
| 13 | ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 13 | ශ්‍රවණාගාර ජල බිල්පත් පියවිම - 2022.07.10 - 2022.08.10 දක්වා | 1877.31 |
| 14 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 14 | දුරකථන ජාල බිල්පත් පියවිම | 27899.68 |
| 15 | පී.වී. දයාසිරි | 15 | ප්‍රධාන කාර්යාලයේ කාන්තා වැසිකිලියේ ජල කරාමය සඳහා බිඩේ ෂවර් එකක් දැමිම. | 2600.00 |
| 16 | නාමල් හාඩ්වෙයාර් | 16 | ප්‍රධාන කාර්යාලයේ ගේට්ටු සඳහා ඉබි යතුරු 02 ක්මිලට ගැනිම | 3300.00 |
| 17 | චතුම් ඇඩ්වටයිසින් | 17 | මතුගම සාශනාරක්ෂක බල මණ්ඩලය සංවිධානය කළ පිණ්ඩපාත දාන වැඩසටහන සඳහා බැනර් 03 (6‘X3‘) මුද්‍රණය කිරිම | 6300.00 |
| 18 | එස්. අතපත්තු | 18 | ගල්මත්ත හා හොරවල උප කාර්යාල දෙක සඳහා අවශ්‍ය චාජින් ටෝච්, විදුලි කේතල 1 ක් හා බිත්ති ඔරලෝසු 1 ක් මිලදී ගැනීම | 9375.00 |
| 19 | ඩී.එස්.එම්. නිහාල් රණසිංහ | 19 | පුස්තකාල 7 ක් සඳහා “අපේ කතාව”ග්‍රන්ථ 07 ක් මිලට ගැනීම | 4410.00 |
| 20 | ජයබෝධි වැඩිහිටි සමිතිය ඇතුලත්මුදලිගම | 20 | මතුගම ක්‍රිඩාංගනය ප්‍රවේශ මාර්ගයට කුට්ටිගල් ඇල්ලීම ව්‍යාපෘති මුදල් ගෙවීම | 546100.91 |
| 21 | උපාලි ජේ. ඩයස් | 21 | පුස්තකාල 7 ක් සඳහා ග්‍රන්ථ මිලට ගැනීම | 12600.00 |
| 22 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 22 | නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු බිල්පත් ගෙවීම | 3720.00 |
| 23 | ඇට්ලෝ ඇග්‍රෝ ප්‍රඩක්ට් | 23 | සැසකෝන් පැකට් 03 මිලට ගැනීම (කොම්පෝස්ට් අංගනය සඳහා) | 29850.00 |
| 24 | ඇට්ලෝ ඇග්‍රෝ ප්‍රඩක්ට් | 24 | ඉදල් 20 මිලට ගැනිම (සෞඛ්‍ය අංශය සඳහා) | 4000.00 |
| 25 | මුදල් භාරකරු | 25 | සුළු මුදල් අග්‍රීමය ප්‍රතිපූර්ණය | 21121.00 |
| 26 | කාර්ය භාර නිලධාරි හොරවල උප කාර්යාලය | 26 | සුළු මුදල් අග්‍රීමය ප්‍රතිපූර්ණය | 2475.00 |

| | | | | |
|---|---|---|---|---|
| 27 | කාර්ය භාර නිලධාරි හොරවල උප කාර්යාලය | 27 | සංග්‍රහ වියදම් 2022 ජූලි මස ප්‍රතිපූර්ණය | 1000.00 |
| 28 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 28 | පොදු ගබඩාව සඳහා පෙට්‍රල් ලීටර් 100 මිලදී ගැනීම (රු. 450.00 x 100 = 4500.00) | 45000.00 |
| 29 | ගයාන් මයුරංග තෙවරප්පෙරුම | 29 | 2022 ජූලි මස යටදොල පුස්තකාලය පුවත් පත් බිල්පත් | 12420.00 |
| 30 | ගයාන් මයුරංග තෙවරප්පෙරුම | 30 | 2022 ජූලි මස හේනේගම පුස්තකාලය පුවත් පත් බිල්පත් | 11580.00 |
| 31 | ගයාන් මයුරංග තෙවරප්පෙරුම | 31 | 2022 ජූලි මස නවුත්තුඩුව පුස්තකාලය පුවත් පත් බිල්පත් | 11580.00 |
| 32 | ඩී.සී. සුරේෂ් ලක්මාල් | 32 | 2022 ජුනි, ජූලි මස මතුගම පුස්තකාලය පුවත් පත් බිල්පත් | 41160.00 |
| 33 | පහන් ඉලෙක්ට්‍රිකල්ස් | 33 | විදුලි අංශයට 1.044 වයර් රෝල 25 ක් සඳහා | 185625.00 |
| 34 | පහන් ඉලෙක්ට්‍රිකල්ස් | 34 | ඉන්ෂුලේෂන් ටේප් 100 ක් හා තම්ලර් ස්විච් 250 ක් මිලදී ගැනීම | 45000.00 |
| 35 | සවි සෙවණ ට්‍රේඩින් | 35 | 16W LED බල්බ් 300 මිලදී ගැනීම (1371.00 x 300 = රු. 411300.0010 | 411300.00 |
| 36 | පී.ඒ.එම්.අයි. කල්දේරා | 36 | සෞඛ්‍ය අංශය සඳහා ග්ලවුස් 250, ඉදල් 100 ක් මිලදී ගැනීම (250.00 x 245 = 61250.00) , (රු. 265.00 x100 = රු. 26500.00) | 87750.00 |
| 37 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 36A | ඉන්ධන බිල්පත් ඇමුණුම 2 | 155330.00 |
| | **2022.09.07** | | | |
| 38 | කාර්යාභාර නිලධාරී - වැලිපැන්න | 38 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 2000.00 |
| 39 | සී/ස මතුගම විවිධ සේවා සමුපකාර සමිතිය | 39 | පොදු ගබඩාවට ඩීසල් ලීටර් 400 ක් මිලදී ගැනීම (රු. 430.00 x 400 = 172000.00) | 172000.00 |
| 40 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 40 | ZA - 0452 JCB යන්ත්‍රයට ඩීසල් ලීටර් 130 ක් මිලදී ගැනීම. (රු. 430.00 x 130 = රු. 55900.00) | 55900.00 |
| 41 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 41 | ඉන්ධන බිල්පත් ඇමුණුම 3 | 153080.00 |
| 42 | ගෑස්ටෙක් එනර්ජි ලංකා | 42 | ආදාහනාගාරය සඳහා ලීටෝ 37.5kg ගෑස් සිලින්ඩර් 10 ක් මිලට ගැනීම (රු. 18193.00x10 = රු. 181930.00) | 181930.00 |
| | **2022.09.08** | | | |
| 43 | ඇතුලත්මුදලිගම ප්‍රජා සහයෝගීතා සමිතිය | 43 | 2022.05.30 - 2022.07.30 දක්වා කොම්පෝස්ට් අංගනය ජල ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම | 9000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 44 | මුදල් භාරකරු | 44 | 2022 සැප්තැම්බර් මස වැටුප් හොරවල උප කාර්යාලය | 1500.00 |
| 45 | මුදල් භාරකරු | 45 | 2023 සැප්තැම්බර් මස වැටුප් වැලිපැන්න උප කාර්යාලය | 1000.00 |
| 46 | මුදල් භාරකරු | 46 | 2023 සැප්තැම්බර් මස වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 14600.00 |
| 47 | මුදල් භාරකරු | 47 | 2022 අගෝස්තු සැලසුම් කමිටු දීමනා | 10500.00 |
| 48 | මුදල් භාරකරු | 48 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 8000.00 |
| 49 | මුදල් භාරකරු | 49 | හොරවල උප කාර්යාලය 2022 අගෝස්තු දෛනික වැටුප් | 69263.65 |
| 50 | මුදල් භාරකරු | 50 | 2022 අගෝස්තු මස ව්‍යාපෘති වැටුප් - හොරවල උප කාර්යාලය | 182137.68 |
| 51 | මුදල් භාරකරු | 51 | 2022 අගෝස්තු මස දෛනික වැටුප් වැලිපැන්න උප කාර්යාලය | 103468.71 |
| 52 | මුදල් භාරකරු | 52 | 2022 අගෝස්තු මස ව්‍යාපෘති වැටුප් වැලිපැන්න උප කාර්යාලය | 63994.32 |
| 53 | මුදල් භාරකරු | 53 | 2022 අගෝස්තු මස දෛනික වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 222441.42 |
| 54 | මුදල් භාරකරු | 54 | 2022 අගෝස්තු මස ව්‍යාපෘති වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 370428.66 |
| 55 | මුදල් භාරකරු | 55 | 2022 අගෝස්තු මස ඩෙංගු මර්ධන වැටුප් මතුගම ප්‍රධාන කාර්යාලය | 243670.88 |
| 56 | මුදල් භාරකරු | 56 | 2022 අගෝස්තු මස විෂබීජහරණ වැඩසටහන වැටුප් | 199366.92 |
| | **2022.09.09** | | | |
| 57 | එන්.එස්. නානායක්කාර | 57 | අඹේතැන්න මාර්ගය අළුත්වැඩියා කිරීම 1 1/2 ගල් කියුබ් 1.10 ක් මිලදී ගැනීම | 14300.00 |
| | **2022.09.12** | | | |
| 58 | අර්ජුන කිරිඇල්ල | 58 | 2020.08.30 ත්‍රිරෝද රථ 7ක් සඳහා ඉන්ධන ලීටර් 5 බැගින් ලබා ගත් අත්තිකාරම් පියවීම | 15750.00 |
| 59 | අරුණ බුද්ධික ජිනදාස | 59 | JG - 4546 ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ගත් අත්තිකාරම් පියවීම | 900.00 |
| 60 | අර්ජුන කිරිඇල්ල | 60 | 2022 සැප්තැම්බර් මහ සභාව සඳහා සංග්‍රහ සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 10000.00 |
| 61 | කාර්යභාර නිලධාරී - හොරවල | 61 | මුද්දර අග්‍රිමය ප්‍රතිපූර්ණය | 1910.00 |
| 62 | ඩබ්.ඩී. සුනිල් ශාන්ත | 62 | 2022 අගෝස්තු මස ආදායම් පරීක්ෂක වැඩ බැලීමේ දීමනා | 4523.33 |
| 63 | මුදල් භාරකරු | 63 | 2022 අගෝස්තු සභික ගමන් වියදම් | 72500.00 |
| 64 | මුදල් භාරකරු | 64 | 2022 සැප්තැම්බර් සභික දීමනා | 480000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 65 | සී/ස මතුගම විවිධ සේවා සමුපකාර සමිතිය | 65 | ZA - 0452 JCB යන්ත්‍රයට ඩීසල් ලීටර් 40 ක් මිලදී ගැනීම. (රු. 430.00 x 40 = රු. 17200.00) | 17200.00 |
| 66 | එන්.එස්. නානායක්කාර | 66 | අබේතැන්න මාර්ගය අළුත්වැඩියාව සඳහා අමුද්‍රව්‍ය මිලට ගැනීම<br>ABC කියුබ් 3x1.10 = 13000.00 = 42900.00<br>1 ½ කියුබ් 1x 1.10 = 13000.00 = 14300.00<br>¾ කියුබ් 1x1.10 = 12500.00 = 13750.00<br>චිප්ස් කියුබ් 1x1.10 = 14000.00 = 14500.00 | 86350.00 |
| | **2022.09.13** | | | |
| 67 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 67 | ඩීසල් ලීටර් 200, පෙට්‍රල් ලීටර් 100 ගබඩාව සඳහා මිලදී ගැනීම රු. 430.00 x 200 = රු. 86000.00) (රු. 450.00 x 100 = රු. 45000.00) | 131000.00 |
| 68 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | 68 | ZA - 6204 බොබ් කැබ් යන්ත්‍රය රක්ෂණ කිරීම ගාස්තු | 41497.56 |
| | **2022.09.14** | | | |
| 69 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 69 | මාර්ගස්ථ රක්ෂණ මුදල් ගෙවීම | 68910.45 |
| 70 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 70 | 53-4621 ඩීසල් ලීටර් 30 මිළ දී ගැනීම. | 16770.00 |
| 71 | කේ.වී.ඩී. චම්මික රවීන්ද්‍ර | 71 | විදුලි ගබඩාව සඳහා 60W LED බල්බ් 50 ක් මිලදී ගැනීම (රු. 1650.00 x 50 = රු. 82500.00) | 82500.00 |
| 72 | සචි සෙවණ ට්‍රේඩින් | 72 | විදුලි ගබඩාව සඳහා 16W LED බල්බ් 250 ක් මිලදී ගැනීම (1371.00 x 250 = රු. 82500.00) | 342750.00 |
| | **2022.09.16** | | | |
| 73 | ගෑස් ටෙක් එනර්ජි ලංකා | 73 | ආදාහනාගාරය සඳහා 37.5 Kg ලිට්‍රෝ ගෑස් 10 ක් මිලට ගැනීම | 178430.00 |
| 74 | මතුගම ඒජන්සිස් පුද්ගලික සමාගම | 74 | ZA-0452 JCB යන්ත්‍රය සඳහා ඩීසල් ලීටර් 80 මිලට ගැනීම (රු. 430.00 x 80 = 34400.00) | 34400.00 |
| 75 | ඩී.එච්. ජයන්ත | 75 | සෞඛ්‍ය කම්කරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 5171.95 |
| 76 | ටී.ඩී අජිත් කුමාර | 76 | සෞඛ්‍ය කම්කරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 4222.00 |
| 77 | සුමිත් කුමාර අතුකෝරාල | 77 | සෞඛ්‍ය අංශය දෛනික රියදුරු -2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 4131.00 |
| 78 | අනුරුද්ධ ඉන්ද්‍රජිත් | 78 | සෞඛ්‍ය කම්කරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 5584.82 |
| 79 | ජයන්ත ද සිල්වා | 79 | ආදාහනාගාර ක්‍රියාකරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 8200.80 |

| | | | | |
|---|---|---|---|---|
| 80 | සුසන්ත හෙට්ටිආරච්චි | 80 | සෞඛ්‍ය කම්කරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 4769.01 |
| 81 | ඩිලාන් ගුණරත්න | 81 | සෞඛ්‍ය කම්කරු - රාත්‍රී මුර රාජකාරී ආවරණය - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 8569.81 |
| 82 | කේ.වී අරුණ ශාන්ත | 82 | කොම්පෝස්ට් අංගනයේ මුරකරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 7703.20 |
| 83 | එච්.එස්.ඩිලාන් | 83 | ශ්‍රවණාගාර භාරකරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 5610.60 |
| 84 | රංජිත් වීරසිරි | 84 | සෞඛ්‍ය කම්කරු - 2022 ජූලි අතිකාල දීමනා ගෙවීම | 4277.68 |
| 85 | රංජිත් වීරසිරි | 85 | සෞඛ්‍ය කම්කරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 4374.90 |
| 86 | උදාර සමරමාන්න | 86 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - ශරීර සුවතා මධ්‍යස්ථානයේ රාජකාරී - 2022 ජුනි අතිකාල දීමනා ගෙවීම | 1107.33 |
| 87 | ජේ.ඩී ප්‍රභාත් කුමාර | 87 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - ආදාහනාගාරය මුර - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 10940.67 |
| 88 | සී.පී.මුණසිංහ | 88 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - ප්‍රධාන කාර්යාලයේ නිවාඩු දිනවල දිවා මුර සහ යතුරු රාජකාරී - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 9722.00 |
| 89 | එල්.ඒ ගාමිණී | 89 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - ශ්‍රවණාගාරය රාත්‍රී මුර රාජකාරී - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 15301.20 |
| 90 | දීප්ති රංගජීව | 90 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - පොදු වෙළඳපල මුර රාජකාරී - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 9722.00 |
| 91 | කේ.ඒ ලසන්ත කුමාර | 91 | ව්‍යාපෘති කම්කරු - ප්‍රධාන කාර්යලය පිරිසිදු කිරීමේ රාජකාරී - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 5488.60 |
| 92 | එම්.කේ.සමන් ජානක | 92 | රියදුරු - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 8787.86 |
| 93 | එම්.කේ.සමන් ජානක | 93 | රියදුරු - 2022 ජුනි අතිකාල දීමනා ගෙවීම | 6240.60 |
| 94 | සංජය එරික් ලසන්ත | 94 | මුරකරු - ප්‍රධාන කාර්යාලය - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 11776.80 |
| 95 | යූ.කේ.ඩී සුමිත් | 95 | කාර්යාල කාර්ය සහායක - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 5404.00 |

| | | | | |
|---|---|---|---|---|
| 96 | එච්.ඩබ්.ඩී නීල් ප්‍රසන්න | 96 | කළමනාකරණ සේවා නිලා2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 858.48 |
| 97 | ජී.චන්දන පුෂ්පකුමාර | 97 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - මුර රාජකාරී - 2022 අගොස්තු අතිකාල දීමනා ගෙවීම | 11554.80 |
| 98 | ජේ.ඩී ප්‍රභාත් කුමාර | 98 | රාජකාරී ගමන් වියදම් | 350.00 |
| | **2022.09.20** | | | |
| 99 | මුදල් භාරකරු (ඩබ්.ඒ සුනිල් ශාන්ත) | 99 | ආදායම පරීක්ෂක - 2022 ජූලි නිවාඩු දින වැටුප් ගෙවීම | 1500.00 |
| 100 | ජානක රුවන් දයාරත්න | 100 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - මුර රාජකාරී - 2022 අගොස්තු අතිකාල | 6932.88 |
| 101 | මිහිඳු චන්න කුමාර | 101 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - යතුරු රාජකාරී 2022 අගොස්තු අතිකාල | 5409.71 |
| 102 | ඒ.කේ.කරුණාලාල් ඇපා | 102 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - මුර රාජකාරී 2022 අගොස්තු අතිකාල | 12372.35 |
| 103 | එම්.ඒ සේනාරත්න | 103 | වැඩ ක්ෂේත්‍ර කම්කරු - මුර රාජකාරී 2022 අගොස්තු අතිකාල | 7344.00 |
| 104 | ගයාන් මධුසංක | 104 | 2022 අගොස්තු රාජකාරී ගමන් වියදම් | 2100.00 |
| 105 | කුලංගා ගයාමි ගුණතිලක | 105 | 2022 අගොස්තු රාජකාරී ගමන් වියදම් | 2100.00 |
| 106 | යූ.එස් මුණසිංහ | 106 | 2022 අගොස්තු රාජකාරී ගමන් වියදම් | 2100.00 |
| 107 | කා.හා.නි වැලිපැන්න | 107 | 2022 අගොස්තු සංග්‍රහ වියදම් ප්‍රතිපූර්ණය | 1000.00 |
| 108 | අරුණ බුද්ධික ජිනදාස | 108 | ZA 2657 ආදායම් බලපත්‍ර ලබා ගැනීම අත්තිකාරම් ගැනීම | 8050.00 |
| 109 | ඩී සෞම්‍යසිරි | 109 | ගොඩවැලි ප්‍රවාහනය මාර්ග තැන්පත් මුදල් ආපසු ගෙවීම | 37683.34 |
| | **2022.09.21** | | | |
| 110 | අර්ජුන කිරිඇල්ල | 110 | දැන්වීම් පුවරු අවසර පත් සකස් කිරිම සඳහා ලබා ගත් අත්තිකාරම් පියවීම | 18900.00 |
| 111 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 111 | පොදු ගබඩාව සඳහා පෙට්‍රල් ලීටර් 100 ඩීසල් ලීටර් 200 මිලට ගැනීම | 131000.00 |
| 112 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් | 112 | ආදාහනාගාරය සඳහා 37.5 kg ලාෆ් ගෑස් 16 ක් මිලට ගැනීම (රු. 18625.00 x 16 = රු. 298000.00) | 298000.00 |
| | **2022.09.22** | | | |
| 113 | අගලවත්ත මෝටර්ස් | 116 | ZA-0452 JCB යන්ත්‍රය සඳහා දත් ලබා ගැනීම | 21700.00 |
| 114 | ලංකා විදුලිබල මණ්ඩලය | 117 | සභාවට අයත් ආයතන 31 ක් සඳහා 2022 ජූලි විදුලි බිල්පත් පියවිම | 169922.60 |
| 115 | එම්.ඩබ්. නානායක්කාර | 118 | පොදු ගබඩාව සඳහා D.S 40 ඔයිල් 30L (රු. 1250.00 x 30 = රු. 37500.00) | 37500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 116 | එම්.ඩබ්. නානායක්කාර | 119 | පොදු ගබඩාව සඳහා 2T 10 L මිලට ගැනීම (රු. 1200.00 x 10 = රු. 12000.00) | 12000.00 |
| 117 | එම්.ඩබ්. නානායක්කාර | 120 | AAJ-4210 ත්‍රී රෝද රථයට ඔයිල් 2L ක් මිලට ගැනීම | 2720.00 |
| 118 | පී.එස්.කේ සර්විස් සෙන්ටර් | 121 | 49-8605 ට්‍රැක්ටරය සේවා කිරීම | 36557.00 |
| 119 | චමින්ද ටයර් හවුස් | 122 | JG-4546 ට්‍රැක්ටරය 600x 16 ටයර් 01 මිලදී ගැනීම | 30700.00 |
| 120 | චමින්ද ටයර් හවුස් | 123 | සභාවේ වාහන සඳහා පැච් දැමීම (QQ-1984 = රු. 1400, RB - 2267 = රු. 400.00, ZA-0452 = රු. 750, RB - 2267 = රු. 700, PE-6914 = රු. 500) | 3750.00 |
| 121 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි | 124 | හේනේගම පුස්තකාලය ඡායා පිටපත් යන්ත්‍රය සේවා ගිවිසුම් ගාස්තු | 26768.00 |
| 122 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි | 125 | ෆැක්ස් යන්ත්‍රය වාර්ෂික ගිවිසුම් ගාස්තු | 11760.00 |
| 123 | ඉන්ෆොබිට් ලංකා | 126 | සභාවේ පොදු ගබඩාව සඳහා මුද්‍රණ යන්ත්‍ර වෙනුවෙන් ටෝනර් ලබා ගැනීම | 43930.00 |
| 124 | ඉන්ෆොබිට් ලංකා | 127 | කෝපිවත්ත පුස්තකාලය කී බෝඩ්, මවුස් මිලදී ගැනීම | 4400.00 |
| 125 | නාමල් හාඩ්වෙයාර් | 128 | ආදාහනාගාරයේ ගේට්ටු සඳහා Pad Lock 01 විදුලි අංශයේ ගබඩා දොර යතුරු කට්ටලය මිලදී ගැනීම | 5750.00 |
| 126 | එස් අතපත්තු | 129 | ශ්‍රවණාගාරය හා ආදාහනාගාරයේ මුරකරුවන් සඳහා විදුලි පන්දම් 02 ක් මිලදී ගැනීම | 4980.00 |
| 127 | නෙක්ෆා ඕස්ට්‍රේලියා | 130 | LGS මෘදුකාංගය 2022 වර්ෂික සේවා ගාස්තු | 152102.00 |
| 128 | කල්‍යාණි ට්‍රේඩින් පුද්ගලික සමාගම | 131 | පොදු ගබඩාව සඳහා නිල් පෑන් 500 ක් මිලදී ගැනීම | 10000.00 |
| 129 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලජි | 132 | ෆැක්ස් යන්ත්‍රයේ වර්ණ තීන්ත එකක් හා කළු තීන්ත දෙකක් මිලදී ගැනීම | 35800.00 |
| 130 | ජේ.ඩී කමල් පියසිරි | 133 | ගල්මත්ත වෙළඳපොල වහලය සෑදීම වෙනුවෙන් ගෙවීම | 150000.00 |
| 131 | ජෙම්සිටි පුද්ගලික සමාගම | 134 | LED Chip, LED Drive 150 බැගින් මිලට ගැනීම | 210000.00 |
| 132 | පී.ජී.එස්.මධුභාෂිණී | 135 | හොරවල කුමාරිගෙවත්ත ඉඩමේ PPA 587/3 සැලසුම් ලබාගැනීම වෙනුවෙන් ලබා ගත් අත්තිකාරම් පියවීම | 1120.00 |
| 133 | නීතිඥ රූපසිරි ප්‍රනාන්දු | 136 | L 3862 නඩුව වෙනුවෙන් පෙනී සිටීම හා විභාග සටහන් ලබා ගැනීම | 29500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 134 | නීතිඥ රූපසිරි ප්‍රනාන්දු | 137 | P 4872 නඩුව වෙනුවෙන් පෙනී සිටීම හා විභාග සටහන් ලබා ගැනීම | 33000.00 |
| 135 | නීතිඥ රූපසිරි ප්‍රනාන්දු | 138 | L 3660 නඩුව වෙනුවෙන් පෙනී සිටීම හා විභාග සටහන් ලබා ගැනීම | 21500.00 |
| 136 | නීතිඥ රූපසිරි ප්‍රනාන්දු | 139 | 5/2008 නඩුව වෙනුවෙන් පෙනී සිටීම හා විභාග සටහන් ලබා ගැනීම | 24500.00 |
| 137 | නීතිඥ රූපසිරි ප්‍රනාන්දු | 140 | P 4975 නඩුව වෙනුවෙන් පෙනී සිටීම හා විභාග සටහන් ලබා ගැනීම | 200000.00 |
| 138 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 141 | ඔරලෝසු කණුවේ CCTVකැමරා පද්ධතිය ගාස්තු 2022.06.01 - 2022.08.31 බිල්පත් පියවීම | 6503.20 |
| | **2022.09.23** | | | |
| 139 | එල්.ඒ.එල් ලියනාරච්චි | 142 | ආදාහනාගාරය උදුන අළුත්වැඩියාව කිරීම වෙනුවෙන් ගෙවීම | 660000.00 |
| 140 | එම්.එම්.ජයන්ත ගුණරත්න | 143 | හොරවල උප කාර්යාලටය දින මුද්‍රා 01 ක් සකස් කරදීම වෙනුවෙන් ගෙවීම | 3250.00 |
| 141 | ශ්‍රී ලංකා ටෙලිකොම් | 144 | 2022.08.01 - 2022.08.31 දක්වා දුරකථන ජාල බිල්පත් | 28646.99 |
| 142 | මතුගම ඒජන්සීස් පුද්ගලික සමාගම | 145 | 49-8605 - ZA - 9260 ට්‍රැක්ටරය හා කම්පැක්ටරය සඳහා ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම (49-8605 - ඩීසල් ලීටර් 37.21 x රු. 430.00 = රු. 16003.00), ZA-9260 - ඩීසල් ලීටර් 83 x 430.00 = රු. 35690.00 | 51693.00 |
| 143 | ගුණවර්ධන ගරාජ් | 146 | ABU-3966 ත්‍රී රෝද රථය සේවා කිරීම | 12800.00 |
| 144 | ගුණවර්ධන ගරාජ් | 147 | ABU 3964 ත්‍රී රෝද රථය සේවා කිරීම | 12750.00 |
| | **2022.09.26** | | | |
| 145 | ශක්ති වැඩිහිටි සමිතිය වලගෙදර | 148 | වළගෙදර දකුණ ග්‍රාම නිලධාරී වසමේ ජනපද පාර 10% අතරුදවුම් ගෙවීම | 37911.74 |
| 146 | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් | 149 | යූ.කේ.ඩී. දිප්ති ඉයෝමා මිය ආදේශක කාලය එකතු කර ගැනිම සඳහා විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිම. | 21849.52 |
| 147 | මුදල් භාරකරු (ඩබ්.ඒ සුනිල් ප්‍රසන්න) | 150 | ආදායම් පරීක්ෂක 2022 ජූලි මස නිවාඩු දින වැටුප් ගෙවීම | 2266.00 |
| 148 | ආර්.ප වරුණ ඉෂාන්ත | 151 | 2022 අගෝස්තු මස නිවාඩු දින වැටුප් ගෙවීම | 4973.33 |
| 149 | ඩී.එච්.එන්.ඩී ජයලත් | 152 | සංවර්ධන නිලධාරි - 2022.09.01 - 2022.09.25 දක්වා වැටුප් ගෙවිම | 38991.25 |
| 150 | කේ.කේ.ඩී.ආර්.සංජීව | 153 | 2022 සාහිත්‍ය තරඟ සඳහා ලබාගත් අත්තිකාරම් පියවිම | 6535.00 |

| | | | | |
|---|---|---|---|---|
| 151 | ආර්.එම් සන්දනායක | 154 | කළමනාකරණ සේවා නිලධාරී 2022 අගෝස්තු මස අතිකාල දීමනා ගෙවීම | 12197.25 |
| 152 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 155 | පොදු ගබඩාව සඳහා ඩීසල් ලීටර් 200 ක් මිලදී ගැනීම (රු. 430.00 x 200 = රු. 86000.00) | 86000.00 |
| 153 | සි/ස මතුගම වි.සේ.ස.සමිතිය | 156 | ZA - 0452 JCB යන්ත්‍රය සඳහා ඩීසල් ලිටර් 80 ක් මිලට ගැනීම | 34400.00 |
| | **2022.09.27** | | | |
| **154** | **ලංකා පිරවුම්හල යටදොලවත්ත** | **157** | **ඉන්ධන බිල්පත් ඇමුණුම 3** | **148060.00** |
| | **2022.09.28** | | | |
| 155 | ලංකා පිරවුම්හල යටදොලවත්ත | 158 | ඉන්ධන බිල්පත් ඇමුණුම 4 | 109750.00 |
| 156 | ජයලත් එන්ටර්ප්‍රයිසස් | 159 | පොදු ගබඩාව සඳහා පෙට්‍රල් ලීටර් 10 ක් මිලට ගැනීම (රු. 450.00x10 = රු. 4500.00) | 4500.00 |
| 157 | සි/ස මතුගම වි.සේ.ස.සමිතිය | 160 | PE-1964 ට්‍රැක්ටරය සඳහා ඩීසල් ලීටර් 33.005 ක් මිලට ගැනීම (රු. 430.00 x 33.005 = රු. 14192.15) | 14192.15 |
| 158 | සි/ස මතුගම වි.සේ.ස.සමිතිය | 161 | ZA-0452 JCB යන්ත්‍රයට ඩීසල් ලීටර් 100 ක් හා LL-7571 කෘ කැබ් රථයට ඩීසල් ලීටර් 50 ක් මිලදී ගැනීම (රු. 430.00 x 150 = 64500.00) | 64500.00 |
| 159 | ෆැමිලි එන්ටර්ප්‍රයිසස් | 162 | ආදාහනාගාරය සඳහා 37.5Kg ලාෆ් ගෑස් සිලින්ඩර් 15 ක් මිලට ගැනීම (රු. 18625.00x15 = රු. 279375.00) | 279375.00 |
| | **2022.09.29** | | | |
| 160 | ශක්ති වැඩිහිටි සමිතිය වලගෙදර | 163 | වලගෙදර උතුර කොස්ගහදෙනිය පාර 10% අතරුදවුම් ගෙවීම | 18848.18 |
| 161 | රෝයල් සෙරමික් ලංකා | 164 | තඹරැටිය පෙර පාසලෙහි වැසිකිලිය සෑදීම සඳහා වැසිකිලි පෝච්චියක් මිලදී ගැනීම | 10200.00 |
| 162 | J ලංකා ටෙක්නොලජි | 165 | සූර්ය බලශක්ති පද්ධතිය අලුත්වැඩියාව සඳහා සමීක්ෂණ ගාස්තු ගෙවීම | 7500.00 |
| 163 | විසල් ග්ලාස් ඇන්ඩ් ඇලුමිනියම් | 166 | සභාවේ වාහනව යතුරු රැඳවීම සඳහා යතුරු පුවරුවක් සෑදීම | 17950.00 |
| 164 | කල්‍යාණි ඉලෙක්ට්‍රිකල් | 167 | කොස්ගහකන්ද පෙර පාසල විදුලි පංකා 03 ක් මිලදී ගැනීම | 96000.00 |
| 165 | මුදල් භාරකරු | 168 | සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූර්ණය | 24502.19 |
| 166 | සමගි සුභ සාධක සමිතිය හොරවල | 169 | ගල්මත්ත සතිපොල කුට්ටිගල් ඇතිරිම 10% අතරුදවුම් ගෙවීම | 44341.24 |
| | **සේවක ණය - 2022.09.05** | | | |
| 1 | ඊ.ජී අජිත් කුමාර | 51 | ආපදා ණය | 45132.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2 | එල්.එල්.ඩී යොෂිකා මනෝජි | 52 | ආපදා ණය | 202580.00 |
| 3 | ජී.එම් දිසානායක | 53 | ආපදා ණය | 154357.00 |
| 4 | ජයමුණි ජයන්ත සිල්වා | 54 | ආපදා ණය | 129543.00 |
| 5 | පී.ජී.එස්.මධුභාෂිණී | 55 | ආපදා ණය | 71961.00 |
| 6 | ඩී.සිරිමල් ප්‍රියශාන්ත | 56 | ආපදා ණය | 49256.00 |
| 7 | කේ.ඒ වෙස්මි ක්‍රිශාන්ති | 57 | ආපදා ණය | 250000.00 |
| | **2022.09.23** | | | |
| 8 | ඩී.ජී.එම් රවීන්ද්‍ර ඉඳුනිල් | 58 | ආපදා ණය | 97816.00 |
| | **2022.09.27** | | | |
| 9 | ඉලේපෙරුම චන්දිමා ප්‍රියදර්ශනී | 59 | ආපදා ණය | 142580.00 |
| 10 | ආර්.ඒ.ටී.ජී.ජී.රණවක | 60 | ආපදා ණය | 250000.00 |
| 11 | ඩී.යූ ඉන්දිරා මුණසිංහ | 61 | ආපදා ණය | 250000.00 |
| 12 | එම්.එම්. ජීවන් චතුරංග | 62 | ආපදා ණය | 77982.00 |
| 13 | ඒ.කුමුදුනී පුෂ්පකුමාරි | 63 | ආපදා ණය | 239636.00 |
| 14 | පී.වී.සුදේශ් සමන්ප්‍රිය | 64 | පා පැදි ණය | 6000.00 |
| | **කර්මාන්ත** | | | |
| | **2022.09.26** | | | |
| 1 | කළමණාකරු සමෘද්ධි බැංකුව යටදොලවත්ත | 16 | අළුත්ගම්ගොඩ ක්‍රීඩාපිටිය සකස් කිරීම 10% අතරුදවූම් ගෙවීම | 161083.97 |
| 2 | කළමණාකරු සමෘද්ධි බැංකුව යටදොලවත්ත | 17 | කනත්තගොඩ පාර සංවර්ධනය කිරීම 10% අතරුදවූම් ගෙවීම | 49226.97 |
| 3 | ප්‍රජා ජල ව්‍යාපෘතිය සුභසාධක සමිතිය ඇතුලත්මුදලිගම | 18 | උගුල්වැටිකන්ද පාර සංවර්ධනය කිරීම 10% අතරුදවූම් ගෙවීම | 69126.23 |
| 4 | 805 නැගෙනහිර එකමුතු ග්‍රාම සංවර්ධන සමිතිය | 19 | සාමකන්ද පාර සංවර්ධනය කිරීම 10% අතරුදවූම් ගෙවීම | 49110.19 |
| 5 | වලගෙදරවත්ත එකමුතු සුභ සාධක සමිතිය | 20 | ගල්මත්ත නව මාවත සංවර්ධනය කිරීම 10% අතරුදවූම් ගෙවීම | 69836.54 |

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා :-**

ආවරණ අනුමැතියට යටත් ව කරන ලද ගෙවීම් පිළිබඳ ව මොනවා හරි තියෙනවා නම් අහන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

මේ සභාවේ ප්‍රශ්න පිළිබඳ ව කතා කරන නිසා මට දැන් මගේ ජීවිතේ පිළිබඳ ව ගැටලුකාරී තත්වයක් මතු වෙලා තියෙනවා.මම 05 වෙනි පිටුවේ අංක 69 ශ්‍රී ලංකා රක්ෂණ සමාගම හා සම්බන්ධයෙන් කතා කරන්නේ.මොකද 2019 අයවැය වෙලාවේත් මම පෙන්නලා දුන්නා රක්ෂණය සඳහා වෙන් කරන මුදල් ප්‍රමාණය වැඩියි කියලා.ඒ වෙලාවේ වෙනත් විෂයන්වලට ඒ මුදල් ඇතුළත් කළා.පසුගිය කාලයේත් මම ඔය පිළිබඳ ව හොයා ගෙන ඇවිත් රක්ෂණවලට යන මුදල වැඩියි කියලා පෙන්නලා දීලා විවිධ ආයතනවලින් කොටේෂන් කැඳවලා මේක කරන්න සූදානම් කළා.පසුගිය දවසක ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ මතුගම මේ දක්වා කරගෙන ආපු අළෙවි නියෝජිතයා,''මේ ඉන්නේ අපේ බඩට ගහන මන්ත්‍රීතුමා ''කියලා මට ලොකු දෝෂාරෝපණයක් කළා.නමුත් මම මහජනතාවගේ මුදල් ඉතුරු කර ගැනීම සම්බන්ධයෙනුයි අදහස් දැක්වූයේ.මෙ පමණ කරුණු කාරණා දැනුම් දීලත් මේ සම්බන්ධ ව

විනිවිදභාවයෙන් කටයුතු කරන්න බැහැ.සභාවේ වාහන නිසායි මේ කරුණු පෙන්වා දෙන්නේ.දැන් මේ දක්වා බැලුවොත් 2017දි වාහන 18කට අටලක්ෂ දහදාහක් ගිහින් තියෙනවා.2018 දි වාහන 19ක් සඳහා නමලක්ෂ පනස්අටදාහක් ගිහින් තියෙනවා.2019 වාහන 23ක් සඳහා එකොළොස් ලක්ෂ අනූදෙදාහයි.2020 වාහන 25ක් සඳහා එකොළොස් ලක්ෂ පනස්හයදාහක් වැය වෙලා තියෙනවා.2021 වර්ෂයේ දී වාහන 25ක් රක්ෂණය සඳහා එකොළොස් ලක්ෂ හත්දාහක් ගිහින් තියෙනවා.ඊට අමතර ව මාර්ග රක්ෂණය සඳහාත් රුපියල් 68 000.00ක මුදලක් ගිහින් තියෙනවා.අපි මේ මහජනතාවගෙන් බදු ගහලා ගන්න සල්ලි.එක එක්කෙනාට තියෙන හිතවත්කම හෝ සම්බන්ධතාවය මත මේ විදිහට කරන්න දෙන්න බැහැ.

යම්කිසි නීත්‍යානුකූල තත්ත්වයක් හදාගෙන මේ සල්ලි පිටට යවනවා.නමුත් ලක්ෂ 5ක් 6ක් මේ සභාවට ඉතුරු කර ගන්න පසුබිමක් තමයි මම කතා කරන්න හැදුවේ.ඒ වෙලාවෙ දි මට ලොකු ජීවිත තර්ජනයක් කළා.ඇත්තෙන් ම මම පුද්ගලික දෙයක් ඉතුරු කර ගන්න නෙමෙයි මහජන මුදල් වෙනුවෙන් තමයි පෙනී සිටියේ.එ නිසා සභාවක් වශයෙන් මේ දේවල් අඩු කරගන්න.තව ආයතන කැඳවලා විනිවිදභාවයෙන් මේක කරන්න සහ සාධාරණයක් කරලා මේ රක්ෂණ සමාගමට දෙන එක අත්හිටුවන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒ මන්ත්‍රීතුමා ඒක ඉදිරිපත් කලා.සභාවේ වාහනවලට රක්ෂණය සඳහා විශාල වියදමක් දරන්න වෙනවා කියන එකයි කිව්වේ.ඊට පසුව අපට සමුපකාර රක්ෂණ සමාගම හොඳයි කියන එක පිළිබඳ ව කරුණු දැක්වූවා.

නමුත් ඒ අය ඇවිත් ඉදිරිපත් කළාම ඒ අයගේ ,කන්ඩිෂන් පිළිබඳ අපි සෑහීමකට පත්වුණේ නැහැ.ඊට පස්සේ දැනට තියෙන තත්ත්වය තමයි අපි ශ්‍රී ලංකා රක්ෂණ සමාගම නවත්තන්න ගියේ නැහැ,ඒ රක්ෂණ සමාගම රජයට සම්බන්ධ එකක්.ඒකෙ පිළිගැනීමක් තියෙන නිසා ගොඩක් අය එකේ රක්ෂණය කරනවා.සභාවට ආර්ථික වශයෙන් තියෙන ගැටලුවත් එක්ක වැඩි වියදම් නවත්තලා අඩු වියදමකින් රක්ෂණය කරන්න කියන එක කිව්වේ.ඊට පස්සේ මේ කියන බොබ්කැට් යන්ත්‍රය අප්‍රේල් මාසයේ රක්ෂණයක්.අනිත් රක්ෂණ අපි නතර කලා. අලුත් එක සභාවට දාලා අනුමැතිය සමග කරනවා .

අපේ වාහන රක්ෂණය කරනවා නම් ඒ වාහන 23ට ම නීත්‍යානුකූලව වැලිවේෂන් එකක් ගන්න ඕන.ඒ අපි ගන්න වැලිවේෂන් එක සහ ඒ රක්ෂණ සමාගම ගන්න තක්සේරුවත් අපිට දෙන්න ඕන.සමහර අවුරුදුවල වෙලා තියෙන හැටියට ඒ අයගෙ තක්සේරුව දෙනවා,අපි රක්ෂණ වාරිකය ගෙවනවා. විගණකාධිපතිතුමාගෙන් මම උපදෙස් ගත්තා, නිත්‍යානුකූලව නම් අපේ රක්ෂණ වැලිවේෂන් එක අපි දෙන්න ඕන.ඒකට ගැළපෙනවා නම් විතරයි කවුරු රක්ෂණය කරන්න ආවත් අපි ඒක දෙන්නේ. ඒ අය අඩු ගානකට වැලිවේෂන් එකක් දීලා අඩු වාරිකයක් ගනියි.ඊට පසු අපි ඉල්ලුවා රක්ෂිත නියෝජිතයෙක් නැතුව කෙලින්ම ශ්‍රී ලංකා රක්ෂණ සමාගම දෙන්න කියලා.අපිට ඒකෙත් වට්ටම් දෙනවා කියලා එවලා තිබුණා .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා**

ඒ වට්ටම කීයද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

5%යි.ඒ කොටේෂන් එකේ තිබුණා.අනිත් ඒවගෙත් වෙන විදිහකට ගළපලා හරි ඒක ඇති.රක්ෂිත නියෝජිතයෙක් හිටියොත් එයාට කොමිස් එකක් යනවාමයි.ඒක නවත්තන්න ආයතන කටයුතු කරන්නේ නැහැ. අපි ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ වැලිවේෂන් එක ගන්නවා.දැනට ඇවිත් තියෙන ආයතන දෙකක් තියෙනවා.ඒ දෙකේත් ගන්නවා.අඩුම රක්ෂණය දෙන සමාගම තෝරා ගැනීම සඳහා සභාවට දානවා.අපි හරි වැලිවේෂන් එක නොගෙන කලොත් මෙතන අඩු පාඩුවක් වෙනවා.ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට දෙන්න කියන එක මේ සභාවේදි කතා වුණා.මේ වාහන රක්ෂණය නැතුව පාරේ යන්න බැරි නිසා දැනට අපි මාස තුනකට තියෙන විදිහට කරනවා. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම ඉදිරි මාස තුනේ රක්ෂණ කටයුතු කරනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මාස තුනකට සභා අනුමැතිය දුන්නද ?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මාස තුනට ගන්න අපේ වැලිවේෂන් එක කරන්න ඕන.වැලිවේෂන් එක නොකර කරනවා නම් සභාව තීරණයක් ගන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
අංක 69 යටතේ ශ්‍රී ලංකා රක්ෂණ සමාගමට බොබ්කැට් යන්ත්‍රයක් සඳහා මුදල් යොදවලා තියෙනවා.මට දැනගන්න ඕන සභාව සතුව බොබ්කැට් යන්ත්‍ර දෙකක් තියෙනවා.මම හිතන්නේ එකක් කාලෙකින් රක්ෂණය කරලා නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
එකේ මුල ඉඳලම පොතක් නැහැ.ඒක අපට පළාත් සභාවෙන් දීලා තියෙන ප්‍රදානයක්.එනිසා ඒක අපි තව වාහනයක දාලා තමයි පාරේ අරන් යන්නේ.මොකද ඒක රක්ෂණය කරන්න බැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
මට දැනගන්න ඕන වුනේ ඒක.මොකද යන්ත්‍ර දෙකක් තියෙද්දි එකක් පමණක් රක්ෂණය කිරීමට දාලා තියෙන නිසා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
ඒකට අපි පොතක් හදන්න බැලුවා.නමුත් වැරදි ක්‍රමයට යන්නත් බැරි නිසා පොතක් හදන්න බැහැ.ඒ නිසා ඒක රක්ෂණය කරන්නත් බැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
මට ගෙවීම් සම්බන්ධයෙන් කරුණු කිහිපයක් පැහැදිලි කර ගැනීමට අවශ්‍යයි. ඔබතුමා ඉදිරිපත් කරන ගෙවීම් සටහනේ එකම කාරණය ස්ථාන කිහිපයකම සඳහන් වෙනවා නම් ඒ සඳහන් වෙන්නේ එකම කාරණය ද මාස කිහිපයක ඒවා එකම මාසයක ගෙවලා ද කියලා අපට අපැහැදිලිතාවයක් තියෙනවා.අංක 38 අංක 67 ඔය කියන කතාව ම සඳහන් වෙනවා.ඒ කාරණා දෙක එකක් ද?ඒ දෙක දෙකක් ද කියලා පැහැදිලි කරගත යුතුව තියෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මම මේ විෂය කරන නිලධාරියාට දැනුම් දුන්නා මේක දෙතැනක තියෙන නිසා අද සභාවට මේක දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**
එ පමණක් නෙවෙයි.අංක 68 සහ අංක 153 එකම කාරණාව සඳහන් වෙනවා.අංක 157ත් තියෙනවා.ඒ අනුව අංක 38,68,67,153ආදී වශයෙන්.එහෙම සටහන් කරන්නේ ඇයි කියන ගැටලුව මතු වෙන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මට හිතෙන හැටියට මේ වවුචර් ටික දිනවලට දාලා තියෙන්නේ.මේ බිල් ටික ගෙනත් බලලා මන්ත්‍රීතුමා සෑහීමකට පත් වෙනවා නම් ඒ පිළිබඳව සභාවට කියන්න.

(අදාල විෂය නිලධාරියා පැමිණ බිල්පත් ඉදිරිපත් කර මන්ත්‍රීතුමා ව දැනුවත් කරන ලදී.)

**යෝජනාව**

**6.1.2**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/21/PRO/P18/2022 දරණ ලිපියෙන් මෙම සභාවට අයත් දිප්පිට,කොස්ගහකන්ද සහ නාරවිල යන පෙරපාසල්වල ව්‍යාපෘති පදනම මත සේවය කරන පෙර පාසැල් ගුරු සහ සහායක ව්‍යාපෘති සේවකයින් 08 දෙනාගේ සේවා කාලය 2022.07.04 දින සිට 2023.01.03 දින දක්වා මාස 06ක කාලයකට දීර්ඝ කර ඇත.

2022.01.03 දින වන විට ඔවුන්ගේ මාස 06ක ව්‍යාපෘති සේවා කාලය අවසන් වීමට නියමිත බැවින් හා ඉදිරියටත් ඔවුන්ගේ සේවය අඛණ්ඩ ව යොදවා ගැනීම අත්‍යාවශ්‍ය බැවින් 2023.01.04 දින සිට ඉදිරියට මාස 06කින් ව්‍යාපෘති සේවා කාලය දීර්ඝ කර ගැනීම සහ ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි. (ඇමුණුම 1)

**තීරණය**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/21/PRO/P18/2022 දරණ ලිපියෙන් මෙම සභාවට අයත් දිප්පිට,කොස්ගහකන්ද සහ නාරවිල යන පෙරපාසල්වල ව්‍යාපෘති පදනම මත සේවය කරන පෙර පාසැල් ගුරු සහ සහායක ව්‍යාපෘති සේවකයින් 08 දෙනාගේ සේවා කාලය 2022.07.04 දින සිට 2023.01.03 දින දක්වා මාස 06ක කාලයකට දීර්ඝ කර ඇත.

2022.01.03 දින වන විට ඔවුන්ගේ මාස 06ක ව්‍යාපෘති සේවා කාලය අවසන් වීමට නියමිත බැවින් හා ඉදිරියටත් ඔවුන්ගේ සේවය අඛණ්ඩ ව යොදවා ගැනීම අත්‍යාවශ්‍ය බැවින් 2023.01.04 දින සිට ඉදිරියට මාස 06කින් ව්‍යාපෘති සේවා කාලය දීර්ඝ කර ගැනීම සහ ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.1.12 මේ යෝජනාව පිළිබඳව ඒ මන්ත්‍රීතුමා ඇහුව විදිහට ඒ අයටත් මාස හයක් දීර්ඝ කරන්න පුළුවන්ද කියන එක පිළිබඳ ව අපි ඉල්ලීමක් කරනවා.මාස තුන දීර්ඝ කරන්නේ මීට පෙර අනුමත කරපු පෙර පාසල්වල ගුරුවරියන්ටයි.වර්තමානයේ අනුමත කරපු ගුරුවරියන්ට මාස හයකට තමයි අනුමැතිය දීලා තියෙන්නේ.ඒ පරිදිම කරන්න පුළුවන්ද කියන ඉල්ලීම සභාවේ අදහස අනුව අපි කරන්නම්.

**යෝජනාව**

**6.1.3**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/2-1/කසළ/කළුතර/2022 සහ 2022.10.11 දින දරණ ලිපියෙන් මෙම සභාවේ කසළ කළමනාකරණ සහ විෂබීජහරණ කටයුතු සඳහා ව්‍යාපෘති පදනම මත සේවය කරන ව්‍යාපෘති සේවකයින් 10දෙනාගේ සේවා කාලය 2022.06.28 දින සිට 2022.12.27 දින දක්වා මාස 06 ක කාලයකට දීර්ඝ කර ඇත.

2022.12.27 දින වන විට ඔවුන්ගේ මාස 06ක ව්‍යාපෘති සේවා කාලය අවසන් වීමට නියමිත බැවින් සහ ඉදිරියටත් ඔවුන්ගේ සේවය අඛණ්ඩ ව යොදවා ගැනීම අත්‍යාවශ්‍ය බැවින් 2022.12.28 දින සිට ඉදිරියට මාස 06කින් ව්‍යාපෘති සේවා කාලය දීර්ඝ කර ගැනීම සහ ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි. (ඇමුණුම 2)

තීරණය

පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/2-1/කසළ/කළුතර/2022 සහ 2022.10.11 දින දරණ ලිපියෙන් මෙම සභාවේ කසළ කළමනාකරණ සහ විෂබීජහරණ කටයුතු සඳහා ව්‍යාපෘති පදනම මත සේවය කරන ව්‍යාපෘති සේවකයින් 10දෙනාගේ සේවා කාලය 2022.06.28 දින සිට 2022.12.27 දින දක්වා මාස 06 ක කාලයකට දීර්ඝ කර ඇත.

2022.12.27 දින වන විට ඔවුන්ගේ මාස 06ක ව්‍යාපෘති සේවා කාලය අවසන් වීමට නියමිත බැවින් සහ ඉදිරියටත් ඔවුන්ගේ සේවය අඛණ්ඩ ව යොදවා ගැනීම අත්‍යාවශ්‍ය බැවින් 2022.12.28 දින සිට ඉදිරියට මාස 06කින් ව්‍යාපෘති සේවා කාලය දීර්ඝ කර ගැනීම සහ ඊට අදාළ ව්‍යාපෘති වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

යෝජනාව

6.1.4

2023 ක්‍රියාකාරී සැලැස්ම සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි. (ඇමුණුම 3)

තීරණය

2023 ක්‍රියාකාරී සැලැස්ම සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

යෝජනාව

6.1.5

මතුගම ප්‍රාදේශීය සභාවට අයත් දේපළ 2022 වර්ෂයට ටෙන්ඩර් කරන ලද මුදල සහ එම දේපළ 2023 වර්ෂයට ටෙන්ඩර් කළ යුතු මුදල මතුගම සහ හොරවල,වැලිපැන්න උප කාර්යාලවල ආදායම් පරීක්ෂක මහතා ඉදිරිපත් කර ඇති නිර්දේශ අනුව ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| අනු අංකය | ටෙන්ඩර් කළ යුතු දේපළ විස්තරය | 2022 වර්ෂයට ටෙන්ඩර් කළ මුදල | 2023 වර්ෂයට ටෙන්ඩර් කළ යුතු මුදල |
|---|---|---|---|
| 01 | මතුගම නගරයේ පිහිටි හෝරා ස්ථම්බය | 125700.00 ඉල්ලුම්කරුවකු ඉදිරිපත් වී නැත. | 125700.00 |
| 02 | මතුගම ශ්‍රවණාගාරය අසල කිරිහල | 1100.00 (දෛනික) | 1210.00 (දෛනික) |
| 03 | මතුගම පොදු වෙළඳපල පොදු වැසිකිලිය | 283500.00 | 311850.00 |
| 04 | වැලිපැන්න පොදු වෙළඳපල එළ හරක් මස් කඩය | 1022000.00 | 1125000.00 |
| 05 | ගල්මත්ත නව වෙළඳ සංකීර්ණය කාය වර්ධන මධ්‍යස්ථානය | 156000.00 ඉල්ලුම්කරුවකු ඉදිරිපත් වී නැත. | 156000.00 |

| | | | |
|---|---|---|---|
| 06 | හොරවල උප කාර්යාල භූමියේ එලදාව පොල් ගස් 03,තැඹිලි ගස් 04 | 7780.00 | 10000.00 |
| 07 | නවුත්තුඩුව පෙර පාසල් භූමියේ එලදාව පොල් ගස් 06 තැඹිලි ගස් 01 | 4300.00 | 6000.00 |

<u>තීරණය</u>

මතුගම ප්‍රාදේශීය සභාවට අයත් දේපළ 2022 වර්ෂයට ටෙන්ඩර් කරන ලද මුදල සහ එම දේපළ 2023 වර්ෂයට ටෙන්ඩර් කළ යුතු මුදල මතුගම සහ හොරවල,වැලිපැන්න උප කාර්යාලවල ආදායම් පරීක්ෂක මහතා ඉදිරිපත් කර ඇති නිර්දේශ අනුව ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

| අනු අංකය | ටෙන්ඩර් කළ යුතු දේපළ විස්තරය | 2022 වර්ෂයට ටෙන්ඩර් කළ මුදල | 2023 වර්ෂයට ටෙන්ඩර් කළ යුතු මුදල |
|---|---|---|---|
| 01 | මතුගම නගරයේ පිහිටි හෝරා ස්ථම්බය | 125700.00 ඉල්ලුම්කරුවකු ඉදිරිපත් වී නැත. | 125700.00 |
| 02 | මතුගම ශ්‍රවණාගාරය අසල කිරිහල | 1100.00 (දෛනික) | 1210.00 (දෛනික) |
| 03 | මතුගම පොදු වෙළඳපල පොදු වැසිකිලිය | 283500.00 | 311850.00 |
| 04 | වැලිපැන්න පොදු වෙළඳපල එළ හරක් මස් කඩය | 1022000.00 | 1125000.00 |
| 05 | ගල්මත්ත නව වෙළඳ සංකීර්ණය කාය වර්ධන මධ්‍යස්ථානය | 156000.00 ඉල්ලුම්කරුවකු ඉදිරිපත් වී නැත. | 156000.00 |
| 06 | හොරවල උප කාර්යාල භූමියේ එලදාව පොල් ගස් 03,තැඹිලි ගස් 04 | 7780.00 | 10000.00 |
| 07 | නවුත්තුඩුව පෙර පාසල් භූමියේ එලදාව පොල් ගස් 06 තැඹිලි ගස් 01 | 4300.00 | 6000.00 |

6.1.5 යෝජනාව සභාව අනුමත කළා ම ටෙන්ඩර් විදියට දාලා ප්‍රසිද්ධ කරනවා අපි ඒවා මන්ත්‍රීතුමන්ලාට එවන්නම්.ටෙන්ඩර් එක ආවම සභාගත කරලා තෝරාගන්නේ.මේවා දැන් ටෙන්ඩර් එකට විවෘත කරනවා.

**<u>යෝජනාව</u>**

**<u>6.1.6</u>**

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLGK/01/AD හා 2022.10.12 දිනැති ලිපිය මගින් ව්‍යාපෘති සේවකයින් යොදවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛන සියල්ලම ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත දැණුම් දී ඇත.

ඒ අනුව පහත සඳහන් සේවකයින් සම්බන්ධව සේවයට අදාළව කරන ලද වැඩ විස්තරය (කාර්ය සාධන වාර්තාව) සහා අනුමැතිය ලබා ගැනීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

- ❖ පෙර පාසැල් ගුරු හා පෙර පාසැල් ගුරුසහායිකා

දිප්පිට පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා
කොස්ගහකන්ද පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා
නාරවිල පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා
කෝපිවත්ත පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා

- ❖ කසළ කළමනාකරණ හා විෂබීජහරණ ව්‍යාපෘති සේවක

2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා

**<u>තීරණය</u>**

පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLGK/01/AD හා 2022.10.12 දිනැති ලිපිය මගින් ව්‍යාපෘති සේවකයින් යොදවා ගැනීමට අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ලිපිලේඛන සියල්ලම ඉදිරිපත් කරන ලෙස පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත දැණුම් දී ඇත.

ඒ අනුව පහත සඳහන් සේවකයින් සම්බන්ධව සේවයට අදාළව කරන ලද වැඩ විස්තරය (කාර්ය සාධන වාර්තාව) සහා අනුමැතිය ලබා ගැනීම සඳහා ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

- ❖ පෙර පාසැල් ගුරු හා පෙර පාසැල් ගුරුසහායිකා

දිප්පිට පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා
කොස්ගහකන්ද පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා
නාරවිල පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා
කෝපිවත්ත පෙර පාසැල 2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා

- ❖ කසළ කළමනාකරණ හා විෂබීජහරණ ව්‍යාපෘති සේවක

2022 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා

6.1.6 මේ යෝජනාව යටතේ මේ සේවකයන්ගේ සේවා කාලය ඉස්සර අවුරුද්දකට තිබුණේ.සේවකයෝ බඳවාගන්න චක්‍රලේඛ නිදහස් කරලත් නැහැ. අපේ මුදලින් වැටුප් ගෙවන්නේ.ඒක අපට ප්‍රශ්නයක්.අනෙක් එක මේ ගොනුවලටත් විශාල කාලයක් යනවා.මේවා එක අවුරුද්දකටවත් අනුමැතිය දෙන්න කියලා අපි ඉල්ලන්නම්.

**යෝජනාව**

**6.1.7**

2022 සැප්තැම්බර් මස 13 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ අතිරේක න්‍යාය පත්‍රයේ 6.1.13 යටතේ පළ වූ තක්සේරු ප්‍රතිශෝධන යෝජනාව පහත පරිදි සංශෝධනය විය යුතු ය.

1989 අංක 12 දරණ පළාත් සභා පනත හි දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව සතු වරිපනම් දේපළ සඳහා වසර 5කට වරක් තක්සේරු ප්‍රතිශෝධනයක් සිදු කළ යුතු බැවින් ද දැනට ක්‍රියාත්මක වන්නේ 2014 වර්ෂයේ තක්සේරු කර 2016.01.01 සිට ක්‍රියාත්මක කරන ලද තක්සේරුව බැවින් ද,2020 වර්ෂයේ සිදු කළ තක්සේරු ප්‍රතිශෝධනය 2024 ජනවාරි 01 සිට ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**තීරණය**

2022 සැප්තැම්බර් මස 13 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ අතිරේක න්‍යාය පත්‍රයේ 6.1.13 යටතේ පළ වූ තක්සේරු ප්‍රතිශෝධන යෝජනාව පහත පරිදි සංශෝධනය විය යුතු ය.

1989 අංක 12 දරණ පළාත් සභා පනත හි දෙවන වගන්තිය සමඟ කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 146 වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාව සතු වරිපනම් දේපළ සඳහා වසර 5කට වරක් තක්සේරු ප්‍රතිශෝධනයක් සිදු කළ යුතු බැවින් ද දැනට ක්‍රියාත්මක වන්නේ 2014 වර්ෂයේ තක්සේරු කර 2016.01.01 සිට ක්‍රියාත්මක කරන ලද තක්සේරුව බැවින් ද,2020 වර්ෂයේ සිදු කළ තක්සේරු ප්‍රතිශෝධනය 2024 ජනවාරි 01 සිට ක්‍රියාත්මක කිරීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ තක්සේරුව 2023 වර්ෂයට නොගැනීමට අපි තීරණය කරලා තියෙන්නේ.2024 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජනා කරලා තියෙනවා.

**යෝජනාව**

**6.1.8**

797 කීරන්තිඩිය සිරි සුගත ප්‍රජා මණ්ඩලය,772 ඉදිගස්තුඩුව වීර ප්‍රජා මණ්ඩලය,771 B තල්ගස්ගොඩ පැරකුම් ප්‍රජා මණ්ඩලය,771 බොන්දුපිටිය ගැමුණු ප්‍රජා මණ්ඩලයත් යන ක්‍රියාකාරී ප්‍රජා මණ්ඩලයන් පලාත් පාලන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා ගරු සභා අනුමැතියට ඉදිරිපත් කරමි.

**තීරණය**

797 කීරන්තිඩිය සිරි සුගත ප්‍රජා මණ්ඩලය,772 ඉදිගස්තුඩුව වීර ප්‍රජා මණ්ඩලය,771 B තල්ගස්ගොඩ පැරකුම් ප්‍රජා මණ්ඩලය,771 බොන්දුපිටිය ගැමුණු ප්‍රජා මණ්ඩලයත් යන ක්‍රියාකාරී ප්‍රජා මණ්ඩලයන් පලාත් පාලන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීම සඳහා ගරු සභා අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේ අයගේ ප්‍රජා මණ්ඩල අලුතෙන් ආරම්භ කරලා කාලයක් ගිහිල්ලත් ප්‍රතිසංවිධානය වෙලා නැහැ.මේවා ප්‍රතිසංවිධානය කරලා දෙපාර්තමේන්තුවට යවනවා.අනිත් වසම්වලටත් ප්‍රජා මණ්ඩල ආරම්භ කරන්න කියන ඉල්ලීම කරනවා.

**යෝජනාව**

**6.1.9**

බස්නාහිර පළාත් සංවර්ධන ප්‍රධාන (පොදු ) වැඩසටහන 2022 යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිමානාන කුරුඳුවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීමේ ව්‍යාපෘතිය (අංක N227152449001) ක්‍රියාත්මක කිරීමට ගරු අග්‍රාණ්ඩුකාරතුමා අනුමත කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ(සැලසුම්) අංක CSWP/PLAN/MA10/FI/01-01 හා 2022.10.31 දිනැති ලිපියෙන් සභාව වෙත දන්වා ඇත.ඒ අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගරු සභාවේ අනුමැතියට ඉදිරිපත් කරමි.

**තීරණය**

බස්නාහිර පළාත් සංවර්ධන ප්‍රධාන (පොදු ) වැඩසටහන 2022 යටතේ මතුගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිමානාන කුරුඳුවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීමේ ව්‍යාපෘතිය (අංක N227152449001) ක්‍රියාත්මක කිරීමට ගරු අග්‍රාණ්ඩුකාරතුමා අනුමත කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ(සැලසුම්) අංක CSWP/PLAN/MA10/FI/01-01 හා 2022.10.31 දිනැති ලිපියෙන් සභාව වෙත දන්වා ඇත.ඒ අනුව එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ගරු සභාවේ අනුමැතියට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**යෝජනාව**

**6.1.10**

කළුතර සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ 2022.11.02 දිනැති ACLGK/DO7/AT-23/01 ලිපිය මඟින් **"2023 වර්ෂය සඳහා පළාත් පාලන ආයතනවල වාර්ෂික බඳු පැනවීම"** යන කරුණ යටතේ මෘත ශරීරයක් දහනය කිරීම සඳහා ගෑස් සඳහා පිරිවැය යන්ත්‍ර උපකරණ ක්ෂය වීමට අදාළ වාර්ෂික පිරිවැය සහ අනෙකුත් පිරිවැය එකතු කර අයකරන ගාස්තුව තීරණය කරන ලෙස දන්වා ඇත.එමෙන් ම බල ප්‍රදේශයෙන් පිටත ගාස්තු සංශෝධනය සලකා බැලීමට දන්වා ඇති බැවින් 2022 ඔක්තෝම්බර් මස 11 වන දින මහ සභාවේ 6.1.10 යටතේ කරන ලද යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ රු.**13 000.00**

මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත රු.**18 000.00**

**තීරණය**

කළුතර සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ 2022.11.02 දිනැති ACLGK/DO7/AT-23/01 ලිපිය මඟින් **"2023 වර්ෂය සඳහා පළාත් පාලන ආයතනවල වාර්ෂික බඳු පැනවීම"** යන කරුණ යටතේ මෘත ශරීරයක් දහනය කිරීම සඳහා ගෑස් සඳහා පිරිවැය යන්ත්‍ර උපකරණ ක්ෂය වීමට අදාළ වාර්ෂික පිරිවැය සහ අනෙකුත් පිරිවැය එකතු කර අයකරන ගාස්තුව තීරණය කරන ලෙස දන්වා ඇත.එමෙන් ම බල ප්‍රදේශයෙන් පිටත ගාස්තු සංශෝධනය සලකා බැලීමට දන්වා ඇති බැවින් 2022 ඔක්තෝම්බර් මස

11 වන දින මහ සභාවේ 6.1.10 යටතේ කරන ලද යෝජනාව පහත පරිදි සංශෝධනය කිරීමට ගරු සභාවට ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.සිරිසේන මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

| | |
|---|---|
| මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ | රු.**13 000.00** |
| මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත | රු.**18 000.00** |

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ ආදාහනාගාර යෝජනාව අපි සංශෝධනයට දැම්මා. මේකේ වියදම් ඇස්තමේන්තුවක් ගෙනත් තියෙනවා.මේ වියදම් ඇස්තමේන්තුවේ රුපියල් විසිදාහක් දාලා තිබුනේ.ගෑස්වල මිල ගණන් අඩු වුණු නිසා ඒ සහනය ලබාදීම සඳහා මතුගම බල ප්‍රදේශයේ මෘත ශරීරයක් දහනය කිරීම සඳහා රුපියල් 13000.00ක මුදලකුයි වැවෙන්න දාලා තියෙන්නේ.අපට ආදාහනයක් කරන්න යනවා ආදාහන යන්ත්‍රසූත්‍ර ක්ෂය වීම යටතේ රුපියල් 2 000.00ක මුදලක්.අපි ආදාහනාගාර උදුන්වලට ලොකු මුදලක් වැය කරනවා.දැනට සාමාන්‍ය ගාණක් වශයෙන් අරන් තියෙන්නේ.ගෑස් එකකට රුපියල් 10 668.00 යි.මුළු ගණන රුපියල් 12668.00යි.ඒ අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ එක් මෘත ශරීරයක් දහනය සිදු කිරීම සඳහා රුපියල් 13 000.00ක මුදලක් වැය වෙනවා.අපේ බල ප්‍රදේශයෙන් පිටත ඒවාට දැනට රුපියල් විසිදාහක් අය කරනවා.

ඒ රුපියල් 20,000.00ක මුදල ටිකක් වැඩියි කියලා අපට තේරුණා. ඒක අඩු කරන්න යෝජනා කරන්න උපදෙස් ගත්තාම තාක්ෂණ වාර්තාවක් අරගෙන කරන්න කිව්වා.ඒකේ සාරාංශයයි අපි අද කියෙව්වේ.තාක්ෂණ වාර්තාව අනුව රු. 12668.00 ක් වැය වුණාට අපි පිට එකක් දහනය කරනකොට රු.18 000.00 යෝජනා කරලා තියෙනවා.මම මන්ත්‍රීතුමන්ලාගේ අදහස් අරගෙන කරන්නේ,මේක රුපියල් 18 000.00 ට කරනවද? රු.15 000.00 ට කරනවා ද?පිට ප්‍රදේශයක වුණත් අපේ කොට්ඨාශයේ ම ඉන්න අයගේ ඥාති සම්බන්ධකම් තියෙන මිනිස්සු තමයි ඉන්නේ.රුපියල් විසිදාහක් කියන එක දැන් බැලුවොත් ආර්ථික වශයෙන් අමාරුයි තමයි.ඉතිං අපි කාලීනව බලලා සහනයක් දෙමු.මේකට මොකද කරන්නේ?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

අනෙක් සභාවලත් ඔය ගාණමයි යන්නේ. රුපියල් 18 000.00 ම කරමු.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

දොඩංගොඩ ආසනයේ ගාණ කොහොමද දන්නේ නැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දොඩංගොඩ ආසනෙත් ඒ ගාණමයි යන්නේ.දැන් මේ අගලවත්ත හැරෙන්න වගේ ආසනවලත් ආදාහනාගාර තියෙනවා. ඒ ආදාහනාගාරවලත් රු.18 000.00යි තියෙන්නේ.

යෝජනාව

**6.2**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුඩුගලගේ දොන් රෝහිත මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා:-**

මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවර්ධනය කර ඇති "රන්නගල ඇල්ල" ප්‍රාදේශීය සභාවට පවරා ගෙන පාලනය කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

තීරණය

**6.2**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුඩුගලගේ දොන් රෝහිත මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා:-**

මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවර්ධනය කර ඇති "රන්නගල ඇල්ල" ප්‍රාදේශීය සභාවට පවරා ගෙන පාලනය කරන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුඩුගලගේ දොන් රෝහිත මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා විසින් සථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවය මත ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුඩුගලගේ දොන් රෝහිත මහතා**

මතුගම නියෝජ්‍ය ඇමතිවරයා ප්‍රමුඛව මේ රන්නගල ඇල්ල සංවර්ධනය කරන්න ගත්ත වෙලාවේ මම ඒකට විරුද්ධ බව ප්‍රකාශ කළා.එතන සංවර්ධනය කළාට පස්සේ ගමේ අයට එතැන නාන්න බැරිවෙනවා.පිටින් එන අයගෙන් කරදරයක් වෙනවා.ඒක පුවත්පතේ පළවුණා.දැන් දැන් ඒ සිදුවීම වෙලා තියෙන්නේ. මේ වෙනකොට එතනට විශාල ප්‍රමාණයක් පිටින් එනවා.හැම පෝය දවසකම හැම ඉරිදට ම එතන රණ්ඩුවක් ඇති වෙනවා.පිටින් එන පිරිස නිසා උඩහ ලැයිමේ කට්ටියට පාරට එන්න බැහැ.අනිත් එක දැන් එතැන වල් බිහිවෙලා. මේකට සභාව මැදිහත්වෙලා තීරණයන් නොගත්තොත් අපි එතන නාන්න තියෙන තටාක ටික ගලවන්න ගම්වැසියන් හැටියට තීරණයක් අරගෙන තියෙන්නේ.ඒ වගේම සංවර්ධනය කරපු ඇමතිවරයාට විරුද්ධව උද්ඝෝෂණයක් පැවැත්වීමටත් ගමේ පිරිස සංවිධානය වී ඉන්නවා.ඒ නිසාම මේකට සභාවෙන් ගේට්ටුවක් දාලා යන අයගේ නම් ලියාගෙන,ඒ අය ගෙන එන බෝතල්, ප්ලාස්ටික් ද්‍රව්‍යවල ප්‍රමාණය බලාගෙන ඒවා නැවත ගෙන යෑමට දැනුවත් කරලා මේක විධිමත් අයුරින් කරන්න ඕනේ.මේ ස්ථානයේම මත්පැන් පානය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරන්න ඕන. එතකොට සියලුම දෙනාට නාන්න පුළුවන්. එ නිසා රන්නගල ඇල්ල නිසි පරිදි සංවර්ධනය කර දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ ව්‍යාපෘතිය ගරු අනුප පැස්කුවල් රාජ්‍ය අමාත්‍යවරයා පරිසර අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් කළේ.මේක ප්‍රාදේශීය ලේකම් සතු දේපලක් හැටියටයි හඳුනාගෙන කළේ.මන්ත්‍රීතුමා ඉල්ලන්නේ මේක සභාවට පවරා ගන්න කියන එකයි.අපි මුලින්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සමග දුරකථනයෙන් කතා කළාම ඒ අය මේක අපට භාර දෙන්න කැමතියි.ඉතින් මේක අපි ටෙන්ඩර් කරලා බිල් කඩන ක්‍රමයක්,ඊළඟට එතන ඉන්න තැනක් හදලා මේකෙන් ආදායමක් එන විදිහට හදන්නම්.ඒ වගේම මෙතන පරිසරය ආරක්ෂා වෙන විදියට තමයි කරන්න ඕන. මේකට සභාව එකඟ නම් අපි මේක ඉදිරියට කරගෙන යන්න ව්‍යාපෘති වාර්තාවක් හදමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කමිල් කුමාර මහතා**

මේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්.මේ කාලය තුළ රන්නගල ඇල්ලට දැඩි සංචාරක ආකර්ශනයක් ඇති වෙලා තියෙන අයුරු අපි දැක්කා.මේ එන බොහෝ පිරිස පිට ප්‍රදේශවලින් එන්නේ.මම හිතන්නේ සභාවට මේක පවරා ගත්තොත් තව ටිකක් දියුණු කරලා සභාවටත්

ආදායමක් එන හැටියට සහ ඒ ඇල්ලටත් ආරක්ෂාවක් ලැබෙන විදිහට කටයුතු කරන්න පුළුවන් වෙයි.මේක සභාවට ලාභ ලබා ගැනීමට හොඳ අවස්ථාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පුෂ්පා නන්දනී මහත්මිය**
මේ යෝජනාව ඇත්තටම කාලෝචිතයි.රන්නගල ඇල්ලට ස්නානය සඳහා පිට ප්‍රදේශවලින් පැමිණෙන පිරිස මත්ද්‍රව්‍ය සහ දුම්පානය කරන නිසා එම ස්ථානය අද වෙනකොට පොඩි ළමුන්ට වත් ගමන් කිරීමට සුදුසු තත්ත්වයක නැහැ.මේක සභාවට පවරා ගෙන මේ පිළිබඳව පොලිස් නිලධාරීන්වත් දැනුවත් කරලා නිසි ක්‍රියාමාර්ගයක් ගන්න.මොකද එතන විනයක් නැහැ.මම හිතන්නේ පොඩි ටිකට් එකක් වගේ ලබා දීලා, වාහන නතර කරන ස්ථානයක් හදලා ස්වාභාවයෙන්ම ලැබුණු මේ දායාදය මගින් අපට ලාභයක් ලබා ගන්න පුළුවන්.අපි වුණත් මේකට දායකත්වයක් ලබා දෙන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**
අපි පරිසරයට ආදරේ කරන්න ඕන නිසා මේක ඉතා හොඳ යෝජනාවක්. මෙතන ස්වාභාවයෙන්ම මිනිසාගේ හිත සුව පිණිසම නිර්මාණය වූ ස්ථානයක්.මේ මන්ත්‍රීතුමා කියන්නේ මෙතනට වෙනත් ප්‍රදේශවලින් පැමිණෙන පිරිසගේ හැසිරීම ගමේ අයට කරදරයක් කියලා. ගමේ ජනතාවට මේ නිසා කරදරයක් ඇති නොවිය යුතුයි.මේ සුන්දර ප්‍රදේශ රැකගැනීම සභාව සතු වගකීමක්.මත්ද්‍රව්‍ය භාවිතය,අශෝභන ලෙස හැසිරීම ආදී දේ මේ ස්ථානයෙන් තුරන් කිරීමට පොලීසිය මැදිහත් කර ගන්න ඕන. මේ රන්නගල ඇල්ල ප්‍රදේශය වැනසීමට නොදී කාලයක් යෑමට මත්තෙන් නිසි වැඩ පිළිවෙළක් සකස් කර ඒ සඳහා විධිමත් නීති පද්ධතියක් සකසා දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**
මේ ඇල්ල කැලෑවට ගිහින් තිබුනේ.අපේ අනුප පැස්කුවල් නියෝජ්‍ය ඇමතිතුමාට මේ අවස්ථාවේදී ප්‍රණාමය පුදකරනවා.මේ ස්ථානයට යම් පහසුකමක් සපයලා ඒ ස්ථානය දියුණු කළේ මෙතුමා යි.හැබැයි මේක භාරව හිටියේ ප්‍රාදේශීය ලේකම්තුමිය යි.නමුත් මේ ස්ථානය නිර්මාණය කළාට රැක ගැනීම සඳහා නීති පද්ධතිය සකස් කළේ නැහැ.පොලිස් නිලධාරීනුත් මේ සඳහා මැදිහත් වෙන්නෙම නැහැ.දැනටමත් මෙතන බොහෝ ප්‍රශ්න ඇතිවෙලා තියෙනවා.මේ ඇල්ල අපට නෙමේ දොඩංගොඩ ප්‍රාදේශීය සභාවටයි අයිති.නමුත් දැන් මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මැදිහත් වෙලා මේක කරපු නිසා මේ අයිතිය ලබා ගැනීමටත් අපට ඒක හොඳයි.සුභදතාවයෙන් මේක පවරාගෙන මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**
මේක කාලෝචිත යෝජනාවක්.ඇත්තටම මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හඳුනාගත් මේ වගේ කුඩා දියඇලි තුන හතරක් වගේ තියෙන්නේ.වැලිපැන්න ප්‍රදේශයේ ඒ ඇල්ල සංවර්ධනය කිරීමට සභාපතිතුමා මැදිහත් වෙලා විශේෂ වැඩ කොටසක් ඉටු කරලා තියෙනවා.ඒක ඉතා හොඳයි.මීට පෙර අපි මේ සභාවේ දී මතුගම ප්‍රදේශයට සංචාරක ආකර්ෂණය දිනා දෙන ව්‍යාපෘති තේරුවා,ඒවා පිළිබඳව අපේ අදහස් ප්‍රකාශ කළා.ඒ අනුව බැලුවාම රන්නගල ඇල්ල සුවිශේෂී තැනක්.මේ ඇල්ලට මතුගම ප්‍රදේශයේ පමණක් නෙමෙයි සමස්ත ශ්‍රී ලාංකිකයන් සංචාරකයන් ලෙස පැමිණෙනවා.මම හිතන්නේ දොඩංගොඩ ප්‍රාදේශීය සභාව සහ මතුගම ප්‍රාදේශීය සභාව වෙන්කරන සීමාව වෙන්නේ මේ රන්නගල ඇල්ලයි.මේ ව්‍යාපෘතිය මතුගම ප්‍රාදේශීය ලේකම්තුමිය හරහා නම් සිදු කරලා තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමඟ සාකච්ඡා කරලා මෙවැනි ආදායම් උපදවන්න පුළුවන් ස්ථාන හඳුනාගෙන සභාව මැදිහත්වෙලා විධිමත් වැඩපිළිවෙළක් සකසන්න.මේ සඳහා ඒ ගම්වාසීන් සමඟ සාකච්ඡා කරලා ඔවුන්ට තිබෙන ගැටලු හඳුනාගෙන මේක කරන්න කියන ඉල්ලීම මේ යෝජනාවට සහයෝගයක් වශයෙන් කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
අපි කඩිනමින් ම ඒ ස්ථානයේ වැසිකිළිය සහ එම ස්ථානය පිරිසිදු කිරීම සඳහා අපේ සෞඛ්‍ය අංශයේ සේවකයින් යොදවන්නම්. මේ සඳහා විධිමත් වැඩපිළිවෙළක් කඩිනමින් සකස් කරගමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

මේක ඉතා හොඳ යෝජනාවක් කියන්න පුළුවන්.මොකද තරුණ අයට තමන්ගේ විනෝදාස්වාදය ලබා ගැනීම සඳහා වඩා ආරක්ෂාකාරී ස්ථාන බිහිවෙන්න ඕන.ඒ වගේම මේවා අවභාවිත වෙන්න දෙන්න බැහැ.මොකද තරුණ පිරිස මත්පැන් පානය කරන්න සුදුසු ස්ථානයක් වශයෙන් තමයි ඔය ස්ථානය තෝරාගෙන තියෙන්නේ.මේ ස්ථානයේ මත්ද්‍රව්‍ය පානය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරන්න ඕනා.විනයක් ඇතුව මේ වැඩපිළිවෙළ කඩිනමින් සැකසෙන්න ඕනා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

පළමුවෙන්ම මේ යෝජනාව පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.මම මේ සභාවට පත් වෙලා මාස කීපයකින්ම මතුගම නගරයේ මේ වගේ විනෝද විය හැකි දියඇලි හයක් පිළිබඳ දැනුවත් කිරීමක් කළා,ඒවා හඳුනාගෙන සංවර්ධනය කරන්න කියලා.ඒ අතරින් රන්නගල ඇල්ල සංචාරක ආකර්ෂණය සහිත ස්ථානයක් වශයෙන් දියුණු කිරීම පිළිබඳව මේ තත්ත්වයට උපකාර කළ සියලු දෙනාටම ගෞරවය පුද කරනවා.මම දකින විදිහට මෙම ස්ථානයේ ශික්ෂණයක් තියෙන්න නම් භාරකාරයෙක් ඉන්න ඕන.ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කරලා මතුගම ප්‍රාදේශීය සභාවට එහි නීතිමය අයිතිය ලබා ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.මේක මුදල් උත්පාදනයට යොදාගත හැකි ස්ථානයක් නිසා ටිකට් කැඩීමට එක් සේවකයෙක් සහ මත්පැන් පානය කරන පුද්ගලයින් හඳුනා ගැනීමට තවත් කෙනෙක් යොදවන්න ඕනා.තවද කෝපිවත්ත ඇල්ලකන්ද ප්‍රදේශයේ ගරු සභාපතිතුමාගේ මැදිහත් වීමෙන් මෙවැනි ස්ථානයක් යම්තාක් දුරට දියුණු කරමින් පවතිනවා.ඒ පිළිබඳව අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

අපේ කොට්ඨාශයේ මෙවැනි ස්ථාන හතරක් පමණ තියෙනවා.ඒ අතරින් පළාත් සංචාරක අමාත්‍යාංශයෙන් මේ කටයුතුවලට මුල් තැනක් ලබා දීම සඳහා අපි නාගහවල සහ පොල්දූව තොටුපළ කියන ස්ථාන දෙක පළාත් පාලන අමාත්‍යාංශයට යෝජනා කරලා තියෙනවා.

**<u>යෝජනාව</u>**

## <u>6.3</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

## <u>6.3.1</u>

කොලණිය සුසාන භූමියෙහි පිහිටි සභාව සතු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට විදුලිය ලබා දීමට කටයුතු කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

## <u>6.3.2</u>

ගල්මත්ත මහජන ක්‍රීඩා පිටියට දැඩි අවශ්‍යතාවක් ව පවතින ක්‍රීඩා විවේකාගාරයක් ඉදිකර දෙන මෙන් යෝජනා කරමි.

**<u>තීරණය</u>**

## <u>6.3</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

<u>6.3.1</u>

කොලණිය සුසාන භූමියෙහි පිහිටි සභාව සතු ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට විදුලිය ලබා දීමට කටයුතු කරන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ ඒකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.3.2

ගල්මත්ත මහජන ක්‍රීඩා පිටියට දැඩි අවශ්‍යතාවක් ව පවතින ක්‍රීඩා විවේකාගාරයක් ඉදිකර දෙන මෙන් ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජේසිංහ ආරච්චිගේ විජිත සිල්වා මහතා විසින් ස්ථිර කරන ලද නමුත් මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීමෙන් පසුව සංශෝධනය කර නැවත ඉදිරිපත් කරන මෙන් යෝජනා විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මේ ගොඩනැගිල්ල සභාවේ හිටපු නයනසිරි ජයසිංහ සභාපතිතුමා විසින් ඉදි කරපු ගොඩනැගිල්ලක්.දැන් අවුරුදු 15 ක් 20කට ආසන්න කාලයක් මේ ගොඩනැඟිල්ලේ කිසිවක් සිදුවන්නේ නැහැ.අපේ ප්‍රාදේශීය සභාවේ වලගෙදර උතුර ග්‍රාම සේවා වසමට අයිති කොලණිය සුසාන භූමියේ තියෙන මේ ගොඩනැගිල්ල සක්‍රීය බවට පත් කරවා ගැනීමට සමිතියක් හෝ පැවැත්වීම සඳහා අවම වශයෙන් කටයුතු කරන්න ඕනේ.සුසානභූමි කටයුතුවල දී රාත්‍රී කාලයේ අවශ්‍ය කටයුතුවලට ස්ථානයක් සකස් කර ගැනීමට අවශ්‍ය නිසා මේ ගොඩනැගිල්ල සක්‍රීය කිරීමට විදුලිය ලබා ගැනීමේ අවශ්‍යතාවය පවතිනවා.මේක ගම්වාසීන්ගේ සහ ප්‍රදේශයේ සමිතිවල ඉල්ලීමක්.මේ ගැන අවධානය යොමු කරලා විදුලිය ලබා දෙන්න කියලා සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මම හිතන්නේ අප සතුව තියෙන ප්‍රධාන ක්‍රීඩා භූමියටත් වඩා වූ බිම් ප්‍රමාණයක් පවතින මේ ක්‍රීඩා භූමියේ ක්‍රීඩකයන් සඳහා විවේකාගාරයක දැඩි අවශ්‍යතාවයක් පවතිනවා.හදිසි වර්ෂාවකදී ඒ ක්‍රීඩකයන්ට එන්න වෙලා තියෙන්නේ අපේ ගල්මත්ත උපකාර්යාලයට යි.සමහර වෙලාවට අපේ මුරකරුවෝ නැතිනම් ඒක වසා දමලා තියෙනවා.ක්‍රීඩා කරන ළමුන්ට මේ ක්‍රීඩා පිටිය මහත් අස්වැසිල්ලක් වෙලා තියෙනවා.මේ ක්‍රීඩා භූමියේ තියෙන්නේ ඉතාමත් අවම සම්පත් ප්‍රමාණයක්.හරිහැටි තණකොළවත් නැහැ. ක්‍රීඩා කරන අයගේ එකතුවෙන් සූර්යකෝෂ දෙකක් සවි කරලා උදැසන සහ රාත්‍රී පුහුණුවීම් කටයුතු කිරීමටත් අවශ්‍ය පියවර අරගෙන තියෙනවා.මේක ලොකු මුදල් ප්‍රමාණයක් වැය කරන්න ඕන වැඩක් නෙවෙයි.සභාව සතුව සම්පත් කිහිපයක් තියෙනවා.ඒ අවම පිරිවැයක් යොදලා මේ කටයුතු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

මතුගම හැරෙන්න දැනට මහජන ක්‍රීඩාපිටියක් නැහැ.එහෙම තියෙනවා නම් ඒක මතුගම ප්‍රාදේශීය සභාවේ සටහන් වෙන්න ඕන.වැරදි අවබෝධ දෙන්න එපා.යෝජනා දානකොට නිවැරදිව දාන්න. ඔබතුමාව දැනුවත් කරන්න කිව්වේ.

(මන්ත්‍රීවරුන්ගේ ඝෝෂාව නිසා අදහස් පැහැදිලිව නොඇසේ.)

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මම දන්න විදිහට මේ ක්‍රීඩාංගනය පාසල් ක්‍රීඩාංගනය වශයෙන් තමයි කලාප කාර්යාලය හරහා පවරාගෙන තියෙන්නේ.ඒක අපි යෝජනාවට එකතු කරමු.මේක කලාප කාර්යාලය හරහා මතුගම ප්‍රාදේශීය සභාවට පවරා ගෙන කරන්න සංශෝධනය හැටියට කැමතිනම් ඉදිරිපත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. සිරිසේන මහතා**

අපේ යෝජනාව ගෙනාපු ක්‍රීඩාංගනය තියෙන්නේ මගේ කොට්ඨාශයේ,මම ඔකට 2021 ප්‍රතිපාදනවලින් මේ ක්‍රීඩාංගනය සඳහා මුදල් වෙන් කරන්න ප්‍රාදේශීය සභාවට යෝජනා කළා.මේ වෙලාවේ පාසලේ විදුහල්පතිතුමාගෙන් ඇහුවහම ඒක පාසල් ක්‍රීඩාංගණය කිව්වා. මේක 2021න් පසුව පවරාගත්තද කියලා මම දන්නේ නැහැ.නමුත් පාසල් ක්‍රීඩාංගණයක් මහජන ක්‍රීඩාංගණයක් බවට පත්

කරන්න නම් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය සභාවට දැනුම් දෙන්න ඕන.ඒක ප්‍රාදේශීය සභාවට දැනුම් දීලා නැතිනම් තවමත් ඒ ක්‍රීඩාංගනය මහජන ක්‍රීඩාංගණයක් නෙමෙයි. දැනටමත් අපි මේ පාසල් ක්‍රීඩාංගණය පිරිසිදු කරනවා,පාවිච්චි කරනවා.හැබැයි මේක මහජන ක්‍රීඩාංගණය කියලා සංවර්ධනය කරන්න ගියොත් අපට පාවිච්චි කරන ටිකත් නැති වෙනවා.ඒක නිසා මම කියන්නේ මහජන ක්‍රීඩාංගණයක් ගල්මත්ත ප්‍රදේශයේ දැනට නැහැ කියලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නැහැ.සංශෝධන යෝජනාවක් එකතු කරන්න පුළුවන්. කැමතිනම් දාන්න.මුලින්ම මේක අපට පවරා ගත යුතුයි.මේ ක්‍රීඩා පිටිය දෙන්නේ ලොකු ගණන්වලට.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

ගරු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් අදහස් ඉදිරිපත් කළා.මම මේකට සංශෝධනය ඉදිරිපත් කරන්නම්.මම දන්න විදියට මේක මහජන ක්‍රීඩාපිටියක්.මොකද එතන පස් කපන වෙලාවෙදි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තමයි පස් කපන්න අවසර ගත්තේ.ක්‍රීඩා පිටිය හරහා ගමන් කරන විදුලි රැහැන් පද්ධතියක් ඉවත් කරගන්නත් පාසලෙන් නෙමෙයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුයි අවසර ගත්තේ.මම මේ පොදු වැඩක් කතා කරලා තියෙන්නේ.ඔබතුමාට පුළුවන්නම් මේ ගොඩනැගිල්ල හදාගන්න නීතිමය අවසරය අරන් දෙන්න. මගේ තියෙන සම්පත් ටික යොදාගෙන මේක කරන්නම්.මේ ඉල්ලීමට සාධාරණයක් ඉටු කරන මෙන් ඉල්ලා සිටිනවා.

<u>**යෝජනාව**</u>

<u>**6.4**</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

<u>6.4.1</u>

මතුගම නගරයේ ප්‍රධාන සහ අතුරු මාර්ග පද්ධතියේ රථ වාහන ගමන් කිරීම සඳහා විධිමත් රථ වාහන සැලැස්මක් සකස් කිරීමට පොලිසිය,මාර්ග සංවර්ධන අධිකාරිය,අධ්‍යාපන සහ අනෙකුත් ආයතන සමඟ සාකච්ඡා කර රථ වාහන සැලැස්මක් සකස් කරන ලෙසට යෝජනා කරමි.

<u>6.4.2</u>

මතුගම ආනන්ද මාවතේ නැබඩ පාරේ සිට අගලවත්ත පාර දක්වාත්,ආනන්ද මාවතේ සිට මහජන බැංකුව අසළින් අගලවත්ත පාර දක්වාත් යන මාර්ග පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දීමට සුදුසු බවට යෝජනා කරමි.

<u>6.4.3</u>

මතුගම ප්‍රාදේශීය සභාවට විශාල බරක් ව පවතින වීදි ලාම්පු විධිමත් ආකාරයට සවි කළ යුතු බවට යෝජනා කරමි.

<u>6.4.4</u>

මතුගම නගරයේ ඇති බෝ සෙවණ වෙළඳ සංකීර්ණය (පාතාලය)මේ සඳහා අධිකරණයෙන් ලබා දී ඇති නඩු තීන්දුව ක්‍රියාත්මක කරන ලෙස යෝජනා කරමි.

<u>**තීරණය**</u>

<u>**6.4**</u>

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

<u>6.4.1</u>

මතුගම නගරයේ ප්‍රධාන සහ අතුරු මාර්ග පද්ධතියේ රථ වාහන ගමන් කිරීම සඳහා විධිමත් රථ වාහන සැලැස්මක් සකස් කිරීමට පොලිසිය,මාර්ග සංවර්ධන අධිකාරිය,අධ්‍යාපන සහ අනෙකුත් ආයතන සමඟ

සාකච්ඡා කර රථ වාහන සැලැස්මක් සකස් කරන ලෙසට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.4.2

මතුගම ආනන්ද මාවතේ නැබඩ පාරේ සිට අගලවත්ත පාර දක්වාත්,ආනන්ද මාවතේ සිට මහජන බැංකුව අසළින් අගලවත්ත පාර දක්වාත් යන මාර්ග පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දීමට සුදුසු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.4.3

මතුගම ප්‍රාදේශීය සභාවට විශාල බරක් ව පවතින වීදි ලාම්පු විධිමත් ආකාරයට සවි කළ යුතු බවට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

6.4.4

මතුගම නගරයේ ඇති බෝ සෙවණ වෙළඳ සංකීර්ණය (පාතාලය)මේ සඳහා අධිකරණයෙන් ලබා දී ඇති නඩු තීන්දුව ක්‍රියාත්මක කරන ලෙස සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලද අතර මේ සඳහා නීතිපතිතුමාගෙන් උපදෙස් ලබා ගෙන අධිකරණයෙන් ලබා දී ඇති නඩු තීන්දුව ක්‍රියාත්මක කරන ලෙස මන්ත්‍රීවරුන්ගේ අදහස වූයෙන් ඒ සඳහා සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

අපි මීට කලිනුත් ඉදිරිපත් කළා මතුගම ප්‍රදේශයේ රථවාහන සැලැස්ම පිළිබඳ ව.සමහර මාර්ගවල වාහන තදබදයක් ඇති වෙලා.මිනිස්සු ගහමරාගන්න තත්ත්වයට යනවා.ඒක එක් මංතීරුවකට ගමන් කරන්න සලස්වන්න කියලා ඉල්ලා සිටිනවා.පොලිසියෙනුත් ඉල්ලීමක් කරලා තියෙනවා මේ සාකච්ඡාව සඳහා ප්‍රාදේශීය සභාවට නායකත්වය ගන්න කියලා.ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා ප්‍රාදේශීය සභාව මැදිහත්වෙලා නායකත්වය අරගෙන මේ සඳහා වැඩපිළිවෙළක් සකස් කරන්න කියලා.

මගේ දෙවැනි යෝජනාවට මතුගම ආනන්ද ශාස්ත්‍රාලයේ ආදී ශිෂ්‍ය සංගමයෙනුත් විශේෂ ඉල්ලීමක් තියෙනවා.මොකද පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවය කරන ආනන්ද පාසලේ ආදි ශිෂ්‍යයෙක් ඉන්නවා.ඒ අයගේ මුදල් වෙන් කරලා මේ පාර හදන්න පුළුවන් කියලා තියෙනවා.මොකද සභාවේ බැලුවොත් අපිට පොඩි පාරවල් විශාල සංඛ්‍යාවක් හදන්න පුළුවන්.එනිසා මම ඉල්ලා සිටිනවා මේ නගරයේ ප්‍රධාන අතුරු මාර්ග තවත් තියෙනවා නම් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට පවරා දීම පිළිබඳ අවධානය යොමු කරන්න.

මගේ දෙවැනි යෝජනාව මතුගම ප්‍රාදේශීය සභාවට බරක් ව පවතින වීදි ලාම්පු නිසි ක්‍රමවේදයක් නොමැතිව සවි කරලා තියෙන බව පේනවා.ඉස්සරහට බල්බ් එකකට රුපියල් 2000.00ක් වගේ විශාල මුදලක් වැය වෙනවා. අපේ ප්‍රදේශවල කණුවක් හැර කණුවකට හෝ කණු දෙකකින් දෙකකට හෝ පොදු ක්‍රමවේදයක් හදලා මේ සඳහා නිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.

මගේ හතර වන යෝජනාව ගත්තොත් ඇත්තෙන්ම පාතාලය බොහොම අනාරක්ෂිත තැනක්.පසුගිය කාලයේ පාසල් ශිෂ්‍යයෙක් මේක උඩින් වැටිලා මිය ගියා. මෙතැනට අපට අධිකරණ තීන්දුවක් දීලා තියෙනවා.මේ තීන්දුවට අනුව ක්‍රියා නොකළොත් කවුරු හරි කෙනෙක් අධිකරණයට ගියොත් අපට උත්තර බදින්න වෙනවා.සභාපතිතුමා මේකේ වගකීම භාරගන්න ඕනා.මොකද මේ තියෙන්නේ වටිනා පොදු ඉඩමක්.මේක හදන්න හෝ කඩන්න මොනවා හරි හොඳ තීරණයක් අරගෙන සභාවට ඵලදායි දේකට මේක යොදවන්න කියලා ඉල්ලා සිටිනවා.ඒ වගේම ඇත්තෙන්ම මම මතක් කරන්න කැමතියි මතුගම මේ වෙනකොට ප්‍රපාතයට ගිහින් තියෙනවා.මොකද කිසිම පාලනයක් නැහැ. මත්ද්‍රව්‍ය හැමතැනම තියෙනවා.අගනගරයේ වුණත් රාත්‍රී කාලයේ දී ගමනාගමන පහසුකම් අඩුයි.ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න. මේවාට ප්‍රාදේශීය සභාව මූලිකත්වය ගන්න ඕන.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතාගේ විධිමත් රථවාහන සැලැස්මක් සකසන්න කියන යෝජනාවේදී මේ රථවාහන සැලැස්ම පොලිසියේ තියෙනවා.මසකට වතාවක් කළුතර රථවාහන කමිටුව රැස්වෙලා නගරය පිළිබඳ තීරණ ගන්නවා.ඒ වගේම වාහන නැවැත්වීම පිළිබඳ ප්‍රශ්නයක් දාලා පොලිසිය යෝජනා කරනවා රථවාහන නවත්තන්න වැඩපිළිවෙළක් හදා දෙන්න කියලා.අපි ඒක මේ මාසයේ පටන් ගන්නවා.මන්ත්‍රීතුමා කියන විදිහට අපි ඒක ඒ වෙලාවේ පොලිසිය සමග සමඟ සාකච්ඡා කරලා ඒ සැලැස්ම නැවත සකස් කරන්නම්.ආනන්ද මාවත පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියට පවරා ගන්න කියන එකට අපි එකඟ යි.අපෙන් මේක ආදි ශිෂ්‍ය සංගමයත් කලින් ඉල්ලුවා.අපි ඒක කරනවා.

වීදි ලාම්පු පිළිබඳ යෝජනාවේදී ඔබතුමා කියන්නේ මේ වීදි ලාම්පු ළඟ තියෙන එක පිලිබඳ ව යි. වීදි ලාම්පු එක ළඟ දාන්නේ වංගුවල වගේ වුණාම.විදුලිබල මණ්ඩලයේ වැඩපිළිවෙළක් යන නිසා වැඩිපුර තියෙන එක කොහොමත් අපිට ගලවන්න වෙනවා.

පාතාලය පිළිබඳ යෝජනාවේදී අධිකරණ නියෝගය ක්‍රියාත්මක කරන්න අපි බැඳී ඉන්නවා.පසුගිය දිනක අපි මේ සම්බන්ධව ඒ කඩ හිමියන්ව කැඳවලා අධිකරණය තීන්දුව ක්‍රියාත්මක කරන්න යෝජනා ගත්තා.ඒ තුළ ම තමයි ඒ ගොඩනැගිල්ල පිළිබඳ තාක්ෂණ වාර්තාවක් ගන්න කියලා අධිකරණයෙන් කියලා තියෙන්නේ.ඒ අයට දීලා තියෙන එක වගේම උසාවි ගිය අට දෙනාට සාධාරණයක් කරන්න ඕනේ.ඒ අනුව තව අටක් ඉන්නවා.ඒ අය මේකේ ඉඳලා එලියට ගිහින් හෝ අධිකරනයෙන් තීන්දුවක් දීලා තියෙනවා,කඩ දෙන වෙලාවට සලකා බලන්න කියලා.මම කියන්නේ මේක කඩන්න කියලා නෙවෙයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

මේක අපේ දේපලක්.මේ දේපල ප්‍රයෝජනයක් නොගෙන අපතේ යනවා. මේ යෝජනාවේදී විශේෂයෙන්ම මතක් කරන්න ඕන ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතාත් මමත්(මම මේකේ අට වන විත්තිකරු,එතුමා දාහතර වන විත්තිකරු) අපි මේ අවස්ථාවේදී මේකේ විරෝධය ප්‍රකාශ කරලා තිබුණා.දැන් නමුත් මේක දීර්ඝ කාලයක් ඇවිල්ලා මේ ප්‍රශ්නය වෙනම තැනකට ගිහින් තියෙන්නේ.අපිට මේකෙන් ආදායමක් ලැබෙන්නෙත් නැහැ.අපි මේකට බදු ගෙවනවා.මේ දාලා තියෙන යෝජනාවට මම කියා සිටින්නේ 167 වන වගන්තිය යටතේ උසාවියෙන් තීන්දුවක් දීලා තියෙනවා.ඒක නිසා මම ඉල්ලීමක් කරනවා මේ නඩු තීන්දුව ක්‍රියාත්මක කරන්න නීති පතිවරයාගේ උපදෙස් ලබා ගන්න කියලා.මොකක්ද කරන්න ඕන කියලා හරිම උපදෙස් ලැබෙයි. නැතිනම් අපට ඕන විදිහට කරන්න බැහැ.මේක උසාවියට අපහාස කිරීමක්.උසාවියෙන් තීන්දුවක් දීලා තියෙනවා, මෙතන ගොඩනැගිල්ලක් හදලා නැහැ කියලා මතුගම ප්‍රාදේශීය සභාවෙන් කියනවා.නමුත් දැන් එතැන ගොඩනැගිල්ලක් තියෙනවා.එතකොට ඒක අනවසර

ගොඩනැගිල්ලක්.ඒක නිසා මේ පිළිබඳ කටයුතු කිරීමට උපදෙස් ලබාගැනීම කරන මෙන් ඉල්ලා සිටිනවා.දෙපාර්තමේන්තුවෙන් නීති නිලධාරීන් හරහා උපදෙස් ලබාගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මාහතාගේ පාතාලය සම්බන්ධ අධිකරණ තීන්දුවට අදාළ යෝජනාව මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් වුණු මුල් කාලයේ ඉඳන්ම මටත් මේ යෝජනාව ඉදිරිපත් කරන්න කියලා විවිධ සංගම් විසින් මා වෙත දැනුම් දීලා තිබුණා.නමුත් මේ යෝජනාවට අදාළව සඳහන් කරන නඩු තීන්දුව පිළිබඳව කියවලා බැලුවම මම ඒ නඩු තීන්දුව අර්ථකථනය කර ගන්නා ආකාරය අනුව මේක එක පාරට කඩා ඉවත් කරන්න ඕනේ කියන ඉල්ලීමක් මේ සභාවට කරන්න පුළුවන් කමක් තිබුණේ නැහැ.ඒ නිසා මම ඒ ආකාර යෝජනාවක් ඉදිරිපත් කරන්න අදහස් කළේ නැහැ.හැබැයි අද දින ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා සඳහන් කරන ආකාරයට මම කියන්නේ මේකට ඉහළ නීති උපදේශයක් ලබා ගැනීම තමයි කළ යුතුව තියෙන්නේ.ඔබතුමා ඉදිරිපත් කළ සියලුම කරුණු කාරණා සමග මම එකඟයි.මොකද සභාව විසින් ඉදි නොකරන ලද නමුත් සභාව බදු ගෙවන ලද භූමියක් තුළ ගොඩනැගිල්ලක් තියෙනවා.මේවා මේ රටේ හිටපු දේශපාලනඥයෝ කරපු වැඩ.මේවා අපරාධ.හිතුවක්කාරකමට තමන්ගේ පෞද්ගලික දේපළක් හැටියට මහ ජනතාවගේ දේපල බෙදාහදා ගන්න ගිය දේශපාලනඥයෝ විසින් නිර්මාණය කළ ප්‍රශ්න මේ තියෙන්නේ.ඒ නිසා මම අකමැති මේ පිළිබඳව කතා කරන්න.එනමුත් නීතිඥයෙක් හැටියට මට නිහඬව ඉන්න බැහැ.ඒ නිසා මේ අවස්ථාවේදී මම සඳහන් කරන්නේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා කියන හැටියට අපි මේක පළාත් පාලන අමාත්‍යාංශයේ නීති නිලධාරීන් හරහා නීතිපතිතුමා වෙත යොමු කරලා මේ නඩු තීන්දුව පිළිබඳව අර්ථකථනයක් ගන්න විග්‍රහ කර ගෙන ඒ අනුව කටයුතු කර ගමු.නැතිනම් මහජනතාවගේ අයිතිවාසිකම් මේකේ තියෙනවා,සභාවේ අයිතිය තියෙනවා,ඒ දේපළවලට වටිනාකමක් තියෙනවා,ඒ දේපළ සංවර්ධනය විය යුතුව තියෙනවා,නැතිනම් ඒ දේපළ ඉවත් කරලා අලුතින් දේපලක් ගොඩනැගිය යුතුව තියෙනවා.ඒ නිසා නීතිපතිතුමාගෙන් උපදෙස් ගැනීම සුදුසුයි.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

මේ පිළිබඳව නීතිඥයෙක් වශයෙන් දැනුවත් කලාට අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතාට ස්තූතිවන්ත වෙනවා.මේක ලොකු අපරාධයක්.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතාගේ යෝජනාවට පක්ෂව මම කතා කරන්නේ.මොකද මිනිස්සු ලක්ෂ 9ක් 10ක් දීලා මේවා හදලා කිසිම වටිනාකමක් නැතුව අද ඉන්නවා.ඒ මිනිස්සුන්ට මොකක්ද වුණේ කියලාවත් බැලුවේ නැහැ. ඒක තමයි මේකේ තත්ත්වය.ඇත්ත කතා කළොත් අට දෙනෙක්ට සාධාරණය ඉෂ්ට කරන්න කියලා නීතියේ තියෙන්නේ.ශාන්ත මේරි මාවතේ අපේ සභාවෙන් වැසිකිලියක් හදන්න වෙන් වුණු ස්ථානයේ කඩ වගයක් හැදුවා.ඒවාට ගත්ත පියවරක් නැහැ.ඒ කඩ අටත් වැරදි යි.සභාපතිතුමාට මීට පෙරත් කැඳෙව්වා.කැඳවලා අහලා තිබුණා මේ ඉල්ලපු අයට නැබඩ පාරේ උඩ තට්ටුවෙන් කඩ 8ක් දෙන්න.ඒ දවස්වල ගිය වියදම දෙනවා නම් එතන ඉන්න අයත් දෙන්න කැමතියි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒ වුණාට උඩ තට්ටුවට කිහිප දෙනෙක් කැමැති වුණේ නැහැ.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

අපි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතාත් ගෙන්නලා කමිටුවකුත් හදලා කතා කරලා බලමු.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මහතා කිව්වා වගේ ඒ පිළිබඳ ව නීතිපතිවරයාගෙන් අහලා බලමු.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ යෝජනාව පිළිබඳව අදහස් පළ වුණු එකට අපි සංශෝධන යෝජනාවක් ඉදිරිපත් කරමු.අධිකරණ නියෝගයට අනුකූල ව අගතියට පත්වූ අය ගෙන්වලා සාකච්ඡා කළා ම ඒ අය සමහරක් කැමති වුණේ නැහැ.අපි මේකට නැබඩ පාරේ උඩු මහලේ කඩ පේළියත්,ශාන්ත මේරි මාවතේ ඉදිරි කොටසත්,පාර්කින් එකේ අපි වෙන් කරන තැනින් හෝ ඒ අට දෙනාටත් තැනක් දෙන්න යෝජනා කළා.ඒ අගතියට පත් වුණු අයට විසඳුම දුන්නොත් තමයි ඒක රඳා පවතින්නේ.සභාවේ එකඟතාවය මේ යෝජනාව හරහා එකතු කරන්න ඔබතුමාලා කැමතිනම් ඒ සංශෝධන එකතු කරන්න.ඒ කියන්නේ අපි කියපු අගතියට පත්වූ අයට ඒ තැන්වලින් කඩ දෙන්නත් ඒ අනුව මේ ගොඩනැගිල්ලේ තාක්ෂණ වාර්තා උසාවිය නියම කරලා තියෙන වගන්තිය සමඟ නීතිපති උපදෙස් අරන් මේක කරන්නත් මේ යෝජනාව සංශෝධනය කරන්න කැමති ද?මේ යෝජනාවට සුදුසු තැනක් දෙන යෝජනාව ඇතුළත් විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

මේ පාතාලය සම්බන්ධව ගත්තොත් 2012 ඉඳලා අවුරුදු දහයක් කල්ගිය ප්‍රශ්නයක්.මම මේ යෝජනාවට කතා කළා බොහෝ තැන්වලදී.නමුත් පවුල් අටක් මහමගට වැටුණු නිසා මම කැමැති වුණේ නැහැ.එවකට දෙසැම්බර් මාසයේ තමයි මේ සම්බන්ධව යෝජනාව ගෙන ආවේ.ඒ නිසා ඒ මිනිසුන්ට තවමත් ඒ සම්බන්ධව ලැබිය යුතු කඩ ටික ලැබිලා නැතිනම් ඇත්තෙන් ම කනගාටුදායක සිද්ධියක්.උප සභාපතිතුමා කිව්වා වගේ ඒ අය ගෙන්නලා කැමති ස්ථානයක් බලලා ඒ ස්ථානය හෝ ඉල්ලනවා නම් ඒ ස්ථානය හරි හදලා දෙන්න මම යෝජනා කරනවා.

වීදි ලාම්පු යෝජනාව මෙතන ඉන්න මන්ත්‍රීවරු බොහෝ දෙනාට අත්‍යවශ්‍ය යෝජනාවක්.මේ සම්බන්ධව අපි විටින් විට වසර ගණනාවක් අදටත් කතා කරනවා.වීදි ලාම්පු සම්බන්ධ ව කතා කරනකොට අපේ ප්‍රදේශය ගත්තොත් මට මේ ගමන වීදි ලාම්පු තුනයි හම්බවෙලා තියෙන්නේ.නමුත් සමහර ප්‍රදේශවලට මීට වඩා වැඩිය දීලා තියෙනවා.මේකට විධිමත් වැඩපිළිවෙළක් තියෙන්න ඕන.මහජනතාවගෙන් යැපෙන ආයතනයක් විදිහට සියලු ම ප්‍රදේශවලට එකසේ ලැබෙන්න ඕන.ඒ නිසා මම ඉල්ලා සිටිනවා කාරක සභාවක් කරලා ඒ නිලධාරීන් මෙතනට ගෙන්නලා වීදි ලාම්පු සවි කළේ කොහොමද කියලා අහන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

පාතාලයේ කඩ සම්බන්ධ යෝජනාව පිළිබඳව කතා කළොත් ගොඩනැගිල්ලක් වගේ දෙයක් ඉදි කරලා තියෙනවා නම් ඒකේ වගකීමක් අපි දරන්න ඕන.ඒ ගොඩනැගිලි පිළිබඳව කාලයක් ගතවන තෙක් හෙව්වේ නැත්තේ ඇයි?2012 ආපු නඩු තීන්දුවක් පිළිබඳව අපි මේ වන තෙක් ක්‍රියා කරලා නැහැ.අපි ජනතාවට වගකියන ආයතනයක් විදිහට මේ සභාවෙන් බදු දීලා තියෙන දේවල්,අපට අයිති දේවල් පිළිබඳව අපට වගකීමක් දරන්න බැරි වෙලා තියෙනවා.මේකට විසඳුමක් ගන්න බැරි වෙලා තියෙන එක අපරාධයක්.මේ විදිහට මන්ත්‍රීවරු තිස් තුනක් නඩත්තු කරගෙන සභාවක් තියාගෙන ඉන්නේ ඇයි?මේකට ඉතා ඉක්මනින් ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් ගන්න.ඒ වගේම අවිධිමත්ව තියෙන සියලුම තැන් පිළිබඳ ලේඛනයක් හදලා මේවට මේ මාස දෙක තුන ඇතුලේ ගන්න පුළුවන් කඩිනම් ක්‍රියාමාර්ග පිළිබඳව සොයා බලන්න.

වීදි ලාම්පු යෝජනාව සම්බන්ධව අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා කතා කරපු දේ සම්බන්ධව හරිම කණගාටුයි.මේ වන තෙක් විපක්ෂයේ හිටපු එක මන්ත්‍රීවරයෙකුට එක වීදි ලාම්පුවක් හෝ කිසිම දෙයක් දීලා නැහැ.ආණ්ඩු පක්ෂයේ හිටපු මන්ත්‍රීවරුන් මෙතනට ඇවිත් කතා කරන්නෙත් අපට දුන්නේ නෑ කියලා. එතකොට මේවා දීලා තියෙන්නෙ කාටද?ඒක ප්‍රශ්නයක්.ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රිවරු හැටියට ඔය වගේ අසාධාරණයකට ලක් වෙනවා නම් ආණ්ඩු පක්ෂයේ ඉඳගෙනත් කොට්ඨාශයට වීදි ලාම්පුවක් හයිකරගන්න බැරිනම් වැඩක් තියෙනවද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

මේ පාතාලය සම්බන්ධ යෝජනාව කිහිප වතාවක්ම අපිත් මේ සභාවේ දී සාකච්ඡා කළා. නමුත් ක්‍රියාත්මක වුණේ නැහැ.මට දැන ගැනීමට අවශ්‍යයි මේ භූමිය තුළ තියෙන කඩ කාමර සඳහා දැනටත් වරිපනම් ගෙවනවාද කියලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නැහැ.වරිපනම් ගෙවන්න අයිතිය නැහැනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

නැහැ.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අතුල මහතාගේ කතාව ඇතුලෙදි ඒ කඩවලට ගෙවනවා කියන එක පිළිබඳව අදහසක් ආවා.ඒකත් එක්ක මම මේ ඇහුවේ.අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා පසුගිය සභාවේ දී පොදු වැසිකිලියක් හදන්න ඉඩමක් ඉල්ලුවා.අපිට දෙන්න ඉඩමක් නැහැ.හැබැයි මේක 2012 නඩු තීන්දුවකින් සභාව සතු වෙලා තියෙන භූමියක්.මම හිතන්නේ මේ නඩු තීන්දුවේදී අනිත් කාටවත් නැවත කඩ ඉදි කිරීමට දෙන්න කියලා නැහැ.සභාවට බලය පවරලා තියෙනවා ඒ ඉදිකරන ඒවා නවත්තන්න කියලා.ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා පසුගිය සභාවේ දී පොදු වැසිකිලියක් හදන්න ඉඩමක් ඉල්ලුවා.අපිට දෙන්න ඉඩමක් නැහැ.හැබැයි මේක 2012 නඩු තීන්දුවකින් සභාව සතු වෙලා තියෙන භූමියක්.මම හිතන්නේ මේ නඩු තීන්දුවේ දී මේ ගොඩනැගිල්ලේ නැවත කඩ ඉදි කිරීමට දෙන්න කියලා කාටවත් කියලා නැහැ.සභාවට බලය පවරලා තියෙනවා ඒ ඉදිකිරීම් නවත්තන්න කියලා.පොදු වැසිකිළිය තිබුණ මීන්මැදුර ළඟ භූමියත් අපට පවරා ගැනීමට නොහැකි නම් අර නඩු තීන්දුවකින් දුන්න භූමියක් පවරාගෙන මොකක් කරන්න ද?

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නැහැ පාතාලයේ භූමියත් නාගරික සංවර්ධන අධිකාරියේ භූමියක්.අපට බදු දීලා තියෙන්නේ.ඒවා කඩලා නැවත යනකොට මාර්ග සංවර්ධන අධිකාරියෙන් අවසර ගන්න ඕන.එතකොට අපට හිතෙන විදිහට දෙන්නේ නැහැ.මේක සරලව අපි කියනවා.මේ සභාවට පත්වෙලා ආපු මන්ත්‍රීවරු තිස්තුන් දෙනෙක් ඉන්නවනේ.මේ කෙටි කාලයේ හරි මේකට විසඳුමක් ගන්න නීතිපති මාර්ගයෙන් උපදෙස් අරන් හෝ කරන්න පුළුවන් වැඩපිළිවෙළ කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චමිලානි රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා ගෙනා පාතාල කඩ සම්බන්ධ යෝජනාව පිළිබඳ අදහස් දක්වන්නේ.ඒ වගේම මම ඇත්තටම පසුගිය කාලයේ ගිය ආණ්ඩුව තිබුණු වෙලාවේ මතුගම බස් නැවතුම්පොලේ අනවසර කඩයක් ඉදිකරලා ඒක විශාල ප්‍රශ්නයක් වුණා.ඒකට වැඩියෙන්ම මැදිහත් වුණේ බෝපිටිය කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රිනිය විදියට මම.එතකොට සභාව ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ.නමුත් යහපාලන ආණ්ඩුවක් තිබුණේ.මතුගම සංවිධායකතුමා එතනට අවසර ලබා දුන්නා.ඒ වෙලාවේ සභාවක් විදිහට නැගී සිටින්න අපි කාටවත් පුළුවන්කමක් තිබුණේ නැහැ.ඒ වෙලාවේ තිබුන බලතල ක්‍රියාත්මක කරලා එතන කඩයක් ඉදිකරන්න දුන්නා.මේ වගේ යෝජනා ඉදිරිපත් කරන කොට ඔබතුමාලා ඒ වෙලාවෙත් මේ වගේ නැගී සිටියා නම් අද ඇත්තටම සතුටු වෙනවා.ඒ වෙලාවේ අපි සතුවූ භූමියක් තමයි අපට අහිමි වුණේ.ඒ භූමිය ගත්තේ උපරිම දේශපාලන බලතල ක්‍රියාත්මක කරලා.ඒක අපට අහිමි වුණා.සී.ටී.බී එකට විතරක් නෙමේ සභාවට අයිති කොටසකුත් එතන තියෙනවා.ගරු ජයන්ත සමරවීර මැතිතුමාගේ ධූර කාලයේ ලක්ෂ විස්සක් පොදු වැසිකිලියක් හදන්න වෙන් කළා.අපට ඒකටත් ස්ථානයක් හොයාගන්න බැරි වුණා.මතුගම ප්‍රාදේශීය සභාවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු විදිහට අපි අසරණ වුණු තැන්

තිබුණා.ඒ නිසා මේක හොඳ යෝජනාවක්.ඒ වගේම මතුගම නගරයේ අනෙක් අනවසර ඉදිකිරීම් සියල්ලත් ඉවත් කරන්න යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී සීතා ඩයස් ජයසිංහ මහත්මිය**

පාතාල යෝජනාව පිළිබඳව බොහෝ කරුණු සාකච්ඡාව වුණා.පාතාලය කියන්නේ දකින්න අප්‍රිය තැනක්. ඒක ඒ විදිහටම මතුගම තියෙනවා.කිසිම පිළිවෙලක් නැහැ.කඩ ගැන කතා කරද්දි දැන් අගලවත්ත පාර සහ අනිකුත් පාරවල්වලත් මාර්ග සංවර්ධන අධිකාරියේ මැදිහත්වීමෙන් අනවසරයෙන් අලුතින් කඩ ඉදිවෙමින් පවතිනවා.ඒ මුදල් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ගන්නේ.කිසිම ප්‍රමිතියකට නැතුව කඩේ ඉදිකරනවා.මේකේ නීති රීති මොනවද කියලා මම දන්නේ නැහැ.ඒ භූමිවල ඉන්නේ අපිට වරිපනම් ගෙවන මිනිස්සු.මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඒ මුදල් ගන්නවා නම් සභාවට බලයක් නැති වේගෙන එන්නේ.මොකක්ද කළ යුත්තේ?මේ වගේ ගැටළු අනිවාර්යෙන්ම විසඳා ගත යුතු යි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මාර්ග සංවර්ධන අධිකාරියේ අය ඒ අයගේ මාර්ග තීරුවනේ දෙන්නේ.ඒ අය බදු මුදලක් අය කර ගන්නවා.ඒකට විරුද්ධ වුණාට මම හිතන්නේ ඒ අය අතුරු නීතියක් හදාගෙන.අපි දැනුම් දුන්නා මේක කරන්න එපා කියලා.මේක දැන් මුළු රටේම කරන දෙයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ කඩ දැමීම තුළ මතුගම නගරයේ මාර්ග අවහිර වෙන්න පුළුවන්.අවලස්සනභාවයට පත් වෙන්න පුළුවන්.මේ පිළිබඳව අපි සභාවක් වශයෙන් මීට වඩා සක්‍රිය පියවරක් ගත යුතු ව තියෙනවා.පළාත් පාලන කොමසාරිස්වරයාගේ හෝ මේ පිළිබඳව අපට තියෙන ප්‍රතිපාදනයන් හොයා බලන්න ඕනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

මේ කඩ ලබා ගැනීමේ බලාපොරොත්තුවක් මට නැහැ.ජගත් මැතිතුමාගේ කාලයේ මොකක් හරි අසාධාරණයක් වුනානම් ඒක නිවැරදි වෙන්න ඕන.අවුරුදු 10ක් 12ක් තිස්සේ කාටවත් ප්‍රයෝජනයක් නැති තැනක් මම දැක්ක නිසා තමයි සමාජයට යහපතක් වෙන්න ඕනේ කියලා ඉදිරිපත් කරන්නේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

පාතාලයේ කඩ පිළිබඳව කාගේවත් විරුද්ධත්වයක් නැහැ.මම සංශෝධන ඉදිරිපත් කළේ අගතියට පත්වූ අයට සාධාරණයක් නොවී මේකෙ ඉදිරියට යන්න බැරි නිසා.මගේ පෞද්ගලික අදහස වෙන්නේ මේ ගොඩනැගිල්ල කැඩුවොත් මේක නැවතත් හදාගන්න එකට අවසර ගන්න නාගරික සංවර්ධන අධිකාරියට දාන්න ඕන.අපි නාගරික සංවර්ධන අධිකාරියේ බදු පදනමින් ඉන්නේ.අපි ඒ අගතියට පත් වූ අයට කඩ දෙන්නම්.ඒ අට දෙනාට කඩයක් දීම සඳහා නැතිනම් තව වාරයක් ඉන්න ඕන.මේ පිළිබඳ ව අපි කතා කරන්නම්.

<u>යෝජනාව</u>

**<u>6.5</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා :-**

**<u>6.5.1</u>**

කැප්පෙටිය ගහලන්ද ගම්මානයට පිවිසෙන ප්‍රධාන මාර්ගය මියගිය රණවිරු කෝප්‍රල් එල්.ජයන්ත කුමාර මාවත නමින් නම් කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

<u>තීරණය</u>

**<u>6.5.1</u>**

කැප්පෙටිය ගහලන්ද ගම්මානයට පිවිසෙන ප්‍රධාන මාර්ගය මියගිය රණවිරු කෝප්‍රල් එල්.ජයන්ත කුමාර මාවත නමින් නම් කිරීමට ගරු සභාවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය

මහතා විසින්කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා විසින් ස්ථිර කරන ලදින් සියලු දෙනාගේ එකඟතාවයෙන් ඒකමතික ව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**

මේ යෝජනාව දාන්න කියලා ජයන්ත කුමාර මහතාගේ පවුලේ අයයි ඉදිරිපත් කළේ.ඒ අය ගමේ ස්වාමීන් වහන්සේ සමඟත් සම්බන්ධ වෙලා ඉල්ලීමක් කළා.ඒ අය සම්පූර්ණයෙන්ම ඒ නම දාන්න නාම පුවරුවට මුදල් වැය කරන්න කැමැත්තෙන් ඉන්නවා.ඒ නිසා ඉල්ලීමක් කළා සභාවේ අනුමැතිය අරන් දෙන්න කියලා.එම ස්ථානයේ මායිමේ පෞද්ගලික ඉඩමේ පුද්ගලයාත් කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දුමගේ දොන් අතුල මහතා**

ඔබතුමාගේ යෝජනාව 198 වන වගන්තිය යටතේ ඉටු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දැන් වෙනත් කරුණු යටතේ අදහස් විමසීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

පෙරදින කරුණු යටතේ අපි සාකච්ඡා කළා සභාවේ නිල මුද්‍රාව වැරදි ලෙස භාවිත කරපු තැනැත්තෙක් සම්බන්ධයෙන්.ඒ සම්බන්ධව සභාවේ ලේකම් විසින් නීතිය හමුවට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත් පැවසුවා.ඒ ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අදාළ ව මේ වන විට යම් කිසි ක්‍රියාමාර්ගයක් මතුගම පොලිසිය විසින් අරන් තියෙනවා ද?එහි ප්‍රගතියක් තියෙනවා ද?ඒ මොනවාද කියලා දැනගන්න කැමතියි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මේ පිළිබඳව ලේකම්තුමියගේ ආරක්ෂාව පැත්තෙන් ගන්න ඕන පියවර සම්බන්ධව මතුගම පොලිසියේ පැමිණිල්ල කළාම එන්න කියලා දිනයක් දැනුම් දීලා තියෙනවා.ලේකම්තුමිය ඒ දිනයේ ගියාට එදා මුකුත් කරලා නැහැ.ඊට පසුව පොලීසිය ආපසු කියලා තියෙනවා පොලිස් අධිකාරියේ පැමිණිල්ලක් කරන්න කියලා.පොලිස් අධිකාරී කාර්යාලයේ නැවත පැමිණිල්ල කරන්න ගියා කිව්වා.ගියාම එකේ මුල් පිටපත නැති නිසා කූඨ ලේඛන යටතේ දාන්නේ නැහැ.එනිසා ඒ කාරණා නැවත මතුගම පොලිසියට ලේකම්තුමිය වාර්තා කරලා තියෙනවා.ඒ ටික සිදුවෙලා තියෙනවා. පොලිසිය කියනවා මුල් පිටපතක් තියෙන්න ඕන කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

කූඨ ලේඛනයක් කියලා පොලිසියෙන් පිළිගන්නේ නැද්ද?අපිට මේක පොලිසියෙන් අහන්න පුළුවන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මුල් පිටපත තියෙන්න ඕන නිසා කූඨ ලේඛන යටතේ යන්න බැහැ කියලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

එහෙමනම් පොලිසියෙන් අහන්න මේ පැමිණිල්ල භාර ගත්තේ නැත්තේ ඇයි කියලා.ලේඛනයක් නැත්තෙ නැනේ.ලේඛනයක් දැක්කේ නැතිනම් ඔහොම ප්‍රශ්නයක් මතු වෙන්නේ නැනේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

භාරගෙන තියෙනවා.කූඨ ලේඛණ චෝදනාව යටතේ යන්න බැහැ කියලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ලේකම්තුමියගේ අත්සන තියෙනවා නම් ඔය කියන ලේඛනයේ සැබෑ අත්සන තියෙනවා නම් ඒ දෙක සංසන්දනය කරන්න තියෙන්නේ.එහෙම ලේඛනයකට සීල් කළොත් නැතිනම් ඒක හොරකමක්.එතන කොපි ගහපු එක තියෙනවා.අපි ළඟ නියම අත්සන තියෙනවනේ.පොලිසිය විමර්ශනය කරනවා කියන්නේ ඒක.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

කූඨ ලේඛනය නොදැක කොහොමද පැමිණිල්ලක් දැම්මේ?ඒ කළ අය ඉන්නවා නම් ඒ අයව පොලිසියෙන් කැඳවයි. මෙතුමිය සීල් එක ගැහුවේ නැතිනම් ඒක හා සම්බන්ධ කොපිය කෙනෙක් අතට පත් වුණේ කොහොමද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ඒ ලේඛනයේ අඩංගු දේ නෙමේ.මෙතුමිය නොතබපු සීල් එකක් මේ ලිපියේ තියෙනවා.මේ තියෙන සිද්ධිය පිළිබඳව කොපියක් ගහගන්න පුළුවන් වුණත් එහෙම තීරණයක් එතුමිය අරගෙන නැහැ.මේ නැබඩ පාරේ කඩ සම්බන්ධව ඒකේ තියෙන්නේ.එහෙම තීරණයක් අරගෙන නැතිනම් එහෙම ලිපියක් ලේකම් මිස් කවදාවත් ලියලාත් නැහැ.ඒ වුණාට ඔය තියෙන ලිපියේ ඒවා තියෙනවා.මේ පිළිබඳව පොලිසිය විමර්ශනයක් කරලා නැති බව පේනවා.අපි මේ පිළිබඳව අද දවසේ සියලුම විස්තර බලාපොරොත්තු වෙන්නේ නැහැ.සුදුසු තීරණයක් ගමු.අපි ඒ පිළිබඳව ඉදිරියේදී සාකච්ඡා කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**

කොම්පෝස්ට් අංගනයේ මෙතෙක් වුණ අක්‍රමිකතා පිළිබඳව අපි කමිටුවක් පත් කරලා ඒකෙනුත් හොයලා දුන්නා.ගිය සතියේ දිනයකත් කොම්පෝස්ට් අංගනයේ ප්ලාස්ටික්,යකඩ සභාව වහලා තියෙන නිවාඩු දිනයක විකුණලා තියෙනවා.ඒ සම්බන්ධයෙන් කවුරුවත් දැනුවත් නැහැ.මේක තවමත් නිවැරදි භාවයට ගන්න බැරි නම් වැඩක් නැහැ.මේ ප්ලාස්ටික්,යකඩ, කාඩ්බෝඩ් ලොරියේ ගේනකොට ඒ ටික ඒ ලොරියේ එන සේවකයෝ විකුණා ගන්නා බව අපි දන්නවනේ.ඒ ගැන ගැටලුවක් නැහැ.ඒ මිනිස්සු කරන සේවය අතිමහත්.ඔවුන්ට දෙන තැන මදි.ඔවුන්ගේ සේවය අගයන්න ඕනා.අපි කමිටුවේ මේ පිළිබඳ ව කතා කළා.කොම්පෝස්ට් අංගනයේ ඉන්න කිහිපදෙනාට මේක විකුණගන්න අවස්ථාවක් දෙන්න කියලා.ඒ ලැබෙන මුදල් කීයක් වුණත් ඒ අයට බෙදලා දෙන්න කියලා.දැන් මේක ඉහළ තනතුරුවල ඉන්න කීප කීපදෙනෙක්ට විතරයි ලැබෙන්නේ.ඊයේ පෙරේදා විකුණපු ඒවාට මොනවාද කළේ ඇහුවම සීනි තේ කොළ ගෙනාවා කිව්වා.එහෙම සිදුවීමක් වෙලා නැහැ.සීනි තේ කොළ ගෙනැවිත් තියෙන්නේ වැඩ කරන කෙනෙක්ගේ නිවසින්.එතන සේවය කරනවාට වෙනම දිරි දීමනාවක් දෙන්න ඕන.තාම රුපියල් 950.00ට වැඩ කරන සමහරු ඉන්නවා.ඒ ලාභය ඒ මිනිස්සු සියලු දෙනාටම ලබා දෙන්න කියන එක දිගින් දිගටම කිව්වා.තවමත් මේකේ හොරකම් වෙනවා නම් අපි කතා කරන දේවල්වල තේරුමක් තියෙනවා ද?ලේකම් මිස්,සභාපතිතුමාට තොරතුරු නාවාට අපට තොරතුරු එනවා.එනිසා මින් ඉදිරියට වත් මේක නොවෙන්න වැඩ කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් මුණසිංහ මහතා ඔය තොරතුරු කිව්වාම මම ඒක හොයා බැලුවා.මම ප්‍රජා සංවර්ධන නිලධාරී සංජීව මහත්තයාට කිව්වා මේ ලැබිලා තියෙන ලාභය කොම්පෝස්ට් අංගනය භාරගෙන අධීක්ෂණය කරන හෝ ඒ මුදල් ගත්ත පුද්ගලයා හරි මේ මුදල ගෙවන්න කියලා.මොකද මේක දැනගත්තාම ඒකට ක්‍රියාමාර්ගයක් ගන්න ඕන.අනිත් එක තමයි

සේවකයෝ ටික මේ වගේ වැඩ කරනවා නම් ඒ සේවකයෝ ටික මාරු කරලා දාන්න.සංජීව මහත්තයා මේකට උත්තර දෙන්න.සභාව වහපු දවසට මේක කරනවා නම් ඔබතුමාලා දැනුවත් වෙන්න ඕනනේ. කවුරු හරි කෙනෙක් ඉන්න ඕන මේක බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**
සභාවේ දේවල් මේ විදිහට විකුණන්න කාටවත් බැහැ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
මේක මේ සභාවේ විතරක් වෙන දෙයක් නෙමෙයි.ඒක සාමාන්‍ය දෙයක්.අපි ඒක එපා කිව්වොත් මේ මිනිස්සු ඒක කරන්නෙත් නැහැ.මේ තනි පුද්ගලයෙක් ඒක විකුණන එක වැරදියි.මොකද අපි ප්‍රමාණයක් දන්නේ නෑනේ.සංජීව මහත්තයා උත්තර දෙන්න.අපි කාරක සභාවක් අවස්ථාවක් යෝජනා කරනවා.

**ප්‍රජා සංවර්ධන නිලධාරී සංජීව මහතා**
කොම්පෝස්ට් අංගනයේ අපද්‍රව්‍යවල නොදිරන ඒවා විකුණනවා.පසුගිය මාසයේ 30 වෙනිදා මම සම්බන්ධ වෙලා ප්ලාස්ටික් බෝතල් 241Kgක් විකුණුවා.රු.4820.00ක මුදලක් ගෙනාවා.ඊට අමතරව විකුණනවා කියලා මාව දැනුවත් කරලා නැහැ.සභාපතිතුමා කිව්වාට පසුව මම කොම්පෝස්ට් අංගනයට ගියා.නාමල් ඒ වෙලාවේ හිටියේ නැහැ.ඒ සේවකයෝ සමඟ මම කතා කළා.ලොරියක් ආව බව කිව්වේ නැහැ.ගෝනි පහළොවක් වගේ ප්‍රමාණයක් කරේ ඇදපු බව කිව්වා.තේ බොන්න සීනි තේ කොළ නැති නිසා ඒවා ගන්න තමයි විකුණුවා කිව්වේ.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් මොකද්ද ඕගොල්ලන්ගේ පියවර?

**ප්‍රජා සංවර්ධන නිලධාරී සංජීව මහතා**
සීනි,තේ කොළ ගන්න විකුණුවා කියලා කිව්වේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමාලක සුරංග විමලසූරිය මහතා**
වැඩ කරන අය කිව්වේ නාමල් තමයි කරලා තියෙන්නේ කියලා.

**ප්‍රජා සංවර්ධන නිලධාරී සංජීව මහතා**
ඉරිදා දවසක තමයි වෙලා තියෙන්නේ.මම ළඟ ඉඳලා විකුණන්න කියලා.ලේකම් මිස් ඒ අයව දැනුවත් කරලා තියෙනවා

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**
දැන් ඔයා ළඟ ඉඳලා විකුණුවේ නැනේ?

**ප්‍රජා සංවර්ධන නිලධාරී සංජීව මහතා**
නැහැ.මම මේ පිළිබඳව දැනුවත් නැහැ.සීනි,තේ කොළ ගෙනාවා කියලා මට කවුරුත් කිව්වෙත් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කසුන් හිරෝෂණ මුණසිංහ මහතා**
මේකේ වංචාවක් වෙලා තියෙන්නේ.මේ ඉන්න සේවකයෝ රැකියාව නැති වෙයි කියලා ඉහළ නිලධාරීන්ට මේවා කියන්න බයයි.මේ සේවකයෝ බොහොම අසරණ වුණු සේවකයෝ.අපි කිව්වේ මේ අපද්‍රව්‍ය විකුණලා ලැබෙන මුදල් සමසේ සියලු දෙනාටම බෙදලා දෙන්න කියලා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මෙහෙම කරමු,මේ අපද්‍රව්‍ය එදා විකුණලා තියෙන බව පැහැදිලියි. මේකට අපට සාමාන්‍ය පරීක්ෂණයක් කරලා තොරතුරු ටික දෙන්න.අපි ඊට පස්සේ තීරණය ක්‍රියාත්මක කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

අපි කොම්පෝස්ට් හලන මැෂින් එක අපේ වාහනවලින් ගෙනාවා.එතනින් ඒක ගන්න එහෙන් ජේ.සී.බී. යන්ත්‍රයක් අරගෙන තියෙනවා.ඒ වියදම් දැරුවා.දැන් ඒක සවි කරන්න කටයුතු කරලා තියෙනවා.අපි ඒක ක්‍රියාත්මක කරලා පොහොර ටික හලනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා**

මගේ කොට්ඨාශය තුළ ප්‍රශ්නයක් මතු වෙලා තියෙනවා හිජ්ලා මාවත සම්බන්ධයෙන්.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

දැන් ඒ පාරට බඩු අදිමින් පවතිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් හමීඩ් රම්සාන් මහතා**

වැලිපැන්න ක්‍රීඩා පිටිය සම්බන්ධව කියද්දී වහින කාලෙට ගංවතුර එනවා. ගංවතුර ඇවිත් දවස් දෙක තුනකින් බැහැලා ගියානම් ඒ ක්‍රීඩා පිට්ටනියේ තරුණයන්ට සෙල්ලම් කරන්න පුළුවන්.නමුත් දැන් බැම්මක් හැදුවානේ.ඒ මගේ කොට්ඨාශයට ආව සල්ලි.ඒ වෙලාවේ මම කිව්වා ළමා හා මාතෘ සායනය නවීකරණය කරන්න දෙන්නෙ කියලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් ලිපි දුන්නා.කොට්ඨාශයේ අබලන් පාරවල් හදන්නත් ලියුම් දුන්නා.නමුත් ඒ ටික වුණේ නැහැ.නමුත් ක්‍රීඩා පිටියේ නවීකරණය කරන්න කියන ඉල්ලීම තියෙනවා.ඒ බැම්ම හැදුවට පස්සේ වාහන එහෙම ගිහිල්ලා මැද හරියේ වළවල් හැදිලා තියෙනවා.ඒ වළවල්වලට වහිද්දි වතුර පිරිලා ආපසු පැවුවත් ඒ වතුර රැදිලා තියෙන නිසා තරුණයන්ට සෙල්ලම් කරන්න බැහැ.ඒ තරුණයෝ ඉල්ලීමක් කරනවා,වතුර රැදිලා තියෙන තැන වතුර බැහැලා යන විදියට වැඩ පිළිවෙලක් හදලා දෙන්න කියලා.ඒ වගේම ළමා හා මාතෘ සායන ව්‍යාපෘතිය පටන් ගත්තට මුකුත් වුණේ නැනේ.2018 විශාල ගංවතුරක් ආවා.ඒකෙන් ළමා හා මාතෘෘ සායනය ඇතුලට අඩි තුනක් විතර වතුර ආවා.එතකොට ඒකට වැඩපිළිවෙළක් විදිහට අපි කබඩ් හදලා දෙන්න බැලුවා.ඒ කාලෙදි මේක නවීකරණය කරන්න රජයෙනුත් කිව්වා.ඒත් ඒකත් වුණේ නැහැ.ඔබතුමා මැදිහත්වෙලා ගොඩනැගිල්ල හැදෙනකම් හරි ළමා හා මාතෘ සායනය අපට ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.ආපදා වෙලාවට ක්ෂණිකව ක්‍රියාත්මක වෙන්න ඕන.අව්ව කාලෙට හරි වතුර බැහැලා යන්නේ නැති බෝක්කු ආදිය හදලා දුන්නා නම් ගංවතුර කාලෙට වතුර ටික බැහැලා යයි.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඔබතුමාට දැනුවත් වෙන්න ලිපියක් තියෙනවා.ලිපිය අරගෙන ඒ අනුව කටයුතු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා**

රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ තරුණ තරුණියන් 34 000 කට පමණ රැකියා ලැබුණා.ඒ රැකියා ලැබුණා වගේ ම මේ වෙනකොට ඒ රැකියා ලැබිලා තියෙන අපේ ප්‍රදේශයේ එක කාන්තාවකට රැකියාව කරන්න වෙලා තියෙන්නේ මොරටුව විශ්ව විද්‍යාලයේ.මම හිතන්නේ බහු කාර්යය සංවර්ධන බලකායට ඒ අයව බඳවා ගෙන තියෙන්නේ.ඒ තැනැත්තියට දවසකට බස් ගාස්තු රු.625.00ක් පමණ යනවා.මාසික වැටුප රු.22500.00 යි. සමෘද්ධියත් අහිමි වී අනෙකුත් අපහසුතා

විඳ දරාගෙන රැකියාවට ගිහින් සුළු වැටුපයි ඉතුරු වෙන්නේ.මේ පිරිස පිළිබඳ ව කාරුණිකව සොයා බලන මෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම අඩු ආදායම්ලාභී පවුල් සඳහා"ගමට එක් නිවසක්"ව්‍යාපෘතිය ආවා.එ මගින් අපේ ගම් පළාතේ දුප්පත් මිනිස්සුන්ගේ නිවාස හැදුණා.ඒ වගේම දෙවන අදියරේ හැදුව නිවාස සම්බන්ධව කතා කළොත් අපේ ගමේ ඉන්න ඒ එක් පුද්ගලයෙකුට ලැබිලා තියෙන නිවස පිළිබඳව කිව්වොත් ඒ මිනිස්සු හිටපු නිවස කැඩුවා.කඩලා තමයි අලුත් නිවෙස හදන්න ගත්තේ.ලක්ෂ එකහමාරයි මේ වෙනකොට ලැබිලා තියෙන්නේ.දැනට මාස අටක් වෙනවා.ඒ මිනිස්සුන්ට ඉන්න තැනක් නැහැ.ඒ නිසා මේ සම්බන්ධව සොයා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම ආඳවල පොල්දූව බෝක්කුව සම්බන්ධයෙන් මාරක ස්ථානයක් තියෙනවා.මේ වෙනකොට බෝක්කුවේ දෙපැත්ත ගිලා බැහැලා තියෙනවා.ඒකට හේතුව පී.ආර්.ඩී. එකෙනුයි මේ බෝක්කුව හැදුවේ.හදලා දැන් මාස කීපයක් යනකොට ඒ දෙපැත්ත පොඩ්ඩක් ගිලා බැහැලා තියෙන්නේ.වැටුනොත් ඇළට වැටෙන්නේ.ඒ බිත්ති කණ්ඩියේ ඔළුව වැදිලා ඒ කෙනා මිය යන්නත් පුළුවන්.ඒ නිසා මේ ගැන සොයා බලන්න කියන ඉල්ලීම කරනවා. පී.ආර්.ඩී.එක දැනුවත් කරලා ඒක කරන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

රැකියා ලක්ශයේ අයව කොළඹ ඇතුළු බොහෝ ප්‍රදේශවලට දැම්මා. සමහර අය නතර වුණා. ඇහුවම කිව්වේ පුරප්පාඩු තියෙන තැනට තමයි දාන්නේ කියලා.ඒ පාඩු විඳගෙන ගිය අය දැන් ස්ථිර වෙන තත්ත්වයට ආපු තැනුත් තියෙනවා.මේ මතුගම අයට දුර ප්‍රදේශවල සේවය කරන්න ලැබිලා තියෙන ගණන බොහොම සීමිතයි.දැන් මේ අදාළ පුද්ගලයාගේ එකත් අපි ඉදිරිපත් කරන්නම්.මේ වර්ෂය තුළ ඒ අයට කරන්න පුලුවන් වෙන්න ඕන.මේ වර්ෂය ඉවර නැනේ.ඒ නිසා මෙයාට නැවත පත්වීම දීලා ස්ථිර වෙන තැනකට යන්න පුළුවන්.සමහර අයගේ මතවාදයක් ගියා මේ දාන්නේ ස්ථිර කරලා නෙවෙයි කියලා.දැන් ගිය ස්ථිර වුණ අයත් ඉන්නවා.මේ අයගේ පෞද්ගලික ලිපිගොනුව ආරම්භ කරලා තියෙන්නේ.අපි මෙයාට ඉල්ලීමක් කරන්නම්. ඇත්තෙන්ම මේකෙන් වුණ හානිය වැඩි යි.හොඳ අඩු යි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පුෂ්පා නන්දනී මහත්මිය**

නොවැම්බර් මස 13වන දින,ඇදහැලුණු ධාරානිපාත වර්ෂාව නිසා ඇති වූ ගංවතුරට වැල්කන්දල හන්දිය සම්පූර්ණයෙන්ම යට වුණා.මගේ කඩේ ඇතුළු කඩ කිහිපයක් ගංවතුරෙන් විපතට පත් වුණා.මේ වෙලාවේ සභාපතිතුමා,ලේකම්තුමිය දැනුවත් කරලා ජේ.සී.බී.එක අරගෙන ගිහිල්ලා වතුර බැස යන සැලැස්සුවා.ඒ අසල බැම්මක් නිසා තමයි මේ ස්ථානය යටවුණේ.මෑත කාලයේ තමයි ඒ බැම්ම ඉදිකළේ.මම කියන්නේ මේ වගේ ඉදිකිරීම් කරන්න දෙන්න එපා.ජේ.සී.බී.එක ලබා දුන්නාට බොහොම ස්තූතියි.වටේම තියෙනවා අනවසර තාප්ප,බැම් ඉදි කරලා.මේ ආරම්භ කිරීම් ඉදිකරන කොට සභාවෙන්ම දැනුවත් කලානම් ඒක මැදිහත්වෙලා නවත්තන්න.මේ වගේ ව්‍යසනවලට මුහුණ දෙන්න වෙන්නේ මෙවැනි අනුවන ඉදිකිරීම් නිසා.මීන් පෙර අවස්ථාවකදී ජල නළ එලීමට මාර්ග හැරුව අවස්ථාවේදී ඒ පාරේ වළවල් ඇති වුණා.ඒ අවස්ථාවේ අපේ පාලිත තෙවරප්පෙරුම හිටපු නියෝජ්‍ය ඇමතිතුමා මැදිහත් වෙලා ඔවුන් අතර ඒ අවස්ථාවේදී මතභේදයකුත් ඇති වුණා.ඒ බැම්ම අද වෙනකොට ජල කඳ හේතුවෙන් කැඩී බිඳී ගිහින් තියෙන්නේ.එක්කෙනෙක් කරන අනුවන ක්‍රියා නිසා මුළු ප්‍රදේශයටම ගංවතුර තර්ජන ඇති වෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ජල සම්පාදන මණ්ඩලයේ කටයුතු නිසා තමයි පාරවල්වල වළවල් මතු වෙන්නෙත්.ප්‍රමිතියක් නැති නිසා නැවත ඒ ජල නළත් මතුවෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පුෂ්පා නන්දනී මහත්මිය**

ඔව්.මේවාට නිසි ක්‍රියාමාර්ග නොගත්තොත් ඒ අය දිගින් දිගටම මේක කරනවා.මේ ඉදිකිරීම් කරනකොටම නිසි ප්‍රමිතිය අනුව කරන්න දෙනවා නම් මේ වගේ දේවල් වෙන්නේ නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

අපේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විජිත සිල්වා මහතා ඉදිරිපත් කළ යෝජනාවට අදහසක් එකතු කරන්න ඕන.ඔබතුමා කියන කාරණේ මේ ප්‍රදේශයේ සහ මේ රටේ දැඩිව තියන ප්‍රශ්නයක්.බහු කාර්ය රැකියා ලැබුන පිරිසගේ ශ්‍රමයට කිසිසේත්ම සරිලන මුදලක් නෙමේ ඔවුන්ට ලැබෙන්නේ.අද රටේ පවතින වාතාවරණයත් සමග ඉතාමත් අපහසු තත්ත්වයක්.මේ වෙනුවෙන් අපේ ගරු විමල් පියතිස්ස ඇමතිතුමා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවට දන්වලා තියෙනවා මේ දුෂ්කරතාවයට ලක්වෙලා තියෙන සියලුම සේවකයන් වෙනුවෙන් නැගී සිටින්න.ඒ වෙනුවෙන් මතුගම ආසනය තුළ අපට කරන්න පුළුවන් දේ කරමු.ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ ඉදිරිපත් කරපු ලිපියේ පිටපතක් ලබා ගන්න පුළුවන් නම් අපට පුළුවන් මැදිහත්වීම කරන්න.මොකද මේ වෙනකොටත් ඒ රැකියා ලක්ෂයට ගිය පිරිසට අපටත් රැකියා විසි තුනක් ලබා දීමට පුළුවන් වුණා.මේ අය අද දැඩි අසරණ තත්ත්වයට පත්වෙලා තියෙන මොහොතේ ඒ වෙනුවෙන් පෙනී සිටීම වැදගත්.ඒ අනුව මම අපේ ගරු මන්ත්‍රීතුමාලාගෙන් ඉල්ලා සිටිනවා ඒ අය වෙනුවෙන් පෙනී සිටින්න.අපි එකතු වෙලා ඒ වෙනුවෙන් සාධාරණයක් ඉටු කරමු කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය**

පොල්දූව බෝක්කුව සම්බන්ධව කතා කරන්නේ.එතන පොඩ්ඩක් වැස්සක් ගංවතුර නැතත් බෝක්කුව උස්සලා සෑදීමෙන් පසුව ඒ දෙපැත්තේම වතුර පිරෙනවා.මෙතන බස් නැවතුම් පොළක් තියෙනවා.බහින අයට හරි අමාරුයි.ඒකට පී.ආර්.ඩී.එක හරහා කුමක් හෝ විසඳුමක් ලබා දෙන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

ඒක අපි දැනුම් දෙන්නම්. ඕගොල්ලන්ගේ මොකක් හරි ඉල්ලීමකට තමයි බෝක්කුව හැදුවේ.ඒක දැන් පැති බැම්ම හදලා නැහැ,අත් වැට නැහැ,පාර දෙපස බැහැලා තියෙන්නේ.ඒ පිළිබඳව දැනුවත් කරලා පී.ආර්.ඩී එකට නැවත ලිපියක් යවන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී තුසිතා ප්‍රියංගනී මහත්මිය**

ඔව්.ඒ වගේම කඹුරුගොඩ ඇළ මාර්ගය තියෙනවනේ.මෙතන බස් හෝල්ට් එකක් තියෙන්නේ.තණකොළ වැවිලා තියෙනවා. තණකොල වැවුණාට එතන ගොඩ වෙලා නැහැ.වළක් තියෙන්නේ.නොදන්න කෙනෙක් අඩිය තිබ්බොත් ඇළට වැටෙන්නේ.මාවත් එතන වැටෙන්න ගිහින් තියෙනවා.ඒ ඇළේ කිඹුල්ලු දෙතුන් දෙනෙක් ඉන්නවා කියලත් කියනවා.පාසල් ළමුන් වැටෙනවා.ඒ නිසා අවදානමක් තියෙනවා. ඒකත් අවධාරණය කරන්න.මම මීන් පෙරත් දැනුවත් කළා.ගොඩ කිරීමක් හෝ කරලා පැති බැම්මක් දාලා වාහන දෙකක් මාරු වෙන්න පුළුවන් පරිදිවත් සකසා දෙන මෙන් ඉල්ලීමක් කරන්න.

**07. කාරක සභා වාර්තාව සලකා බැලීම.**

නැත.

## 08. පුද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම් යටතේ මම සභාපතිතුමා සහ ලේකම්තුමියගෙන් දැන ගැනීමට කාරණා කිහිපයක් තියෙනවා.කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් සභාව ඒකමතිකව කමිටුවක් පත් කරලා කමිටුව මගින් වාර්තාවක් ඉදිරිපත් කළා.අපි ඒකෙන් බලාපොරොත්තු වුණේ කොම්පෝස්ට් අංගනයේ විධිමත්ව ඒ ක්‍රියාවලිය සිදු කිරීමටයි.ඒ ක්‍රියාවලිය පසුගිය වාර කීපයකදී අපේ වාර්තා ඉදිරිපත් කිරීමෙන් පසුවත් යම් සොයා බැලීමක් මිසක් කොම්පෝස්ට් අංගනය සම්බන්ධයෙන් සභාවේ වැඩි අවධානයක් යොමු වුණේ නැහැ කියන චෝදනාව අපි එල්ල කරනවා.මොකද අපිට ලැබෙන තොරතුරු මත අපි ගිහිල්ලා සොයා බැලීම් කළා.ඒ අයට අවශ්‍ය කරන ඉන්ධන පහසුකම් ලබා දීලා තිබුණේ නැහැ.ඒ කුණුගොඩවල් එහා මෙහා කරන ජේ.සී.බී. පහසුකම ලබා දීලා තිබුණේ නැහැ.සභාවේ නිලධාරීන්ට කියලා ඒ දේවල් නොලැබුණාම ඒ සේවකයන් අපිට කියනවා.ඒ සොයා නොබැලීම පිළිබඳව අපි වතාවක් ලේකම්තුමියවත් දැනුවත් කළා.මම හිතන්නේ මේ ක්‍රියාවලිය මීට වඩා විධිමත් කරන්න ඕන.මේ ව්‍යාපෘතිය භාරව ඉන්න ප්‍රජා සංවර්ධන නිලධාරී සංජීව මහතාත් මෙතන ඉන්නවා.මේ සම්බන්ධයෙන් මීට වඩා මැදිහත්වීමක් කරන්න.ඒකේ ප්‍රතිඵල භුක්ති විඳින්න පුළුවන් මේ සභාවටමයි.මේ ක්‍රියාවලිය නැවත ආරම්භ කරන්න.කොම්පෝස්ට් හලන යන්ත්‍රයක් මේ වෙනකොට ලැබිලා තියෙනවා.ඒකත් සවිකරන්න ඕන.කඩිනමින් හලලා තියෙන කොම්පෝස්ට් එතනින් ඉවත් කරන්න ඕනා.දැනටත් මේ කොම්පෝස්ට් අංගනය වෙනුවෙන් ඔබතුමාලගේ අවධානය නිසි පරිදි යොමුවෙලා නැහැ.මීට වඩා අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.

ඒ වගේම දැන්වීම් පුවරු සම්බන්ධයෙන් ගැටලුවක් තියෙනවා.ඒ භාරව ඉන්න නිලධාරියා ස්ථාන මාරුවක් කළා ගැටළුවක් නිසා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

නැහැ එයාව නෙමේ ආර්.අයි.මහත්තයාව මාරු කළේ.ගල්මත්තේ හිටිය ආර්.අයි.මහතාට මේක බාර දුන්නා.එයා දැන් කරගෙන යනවා. කලින් මාරු කරපු ආර්.අයි. මහත්තයා විශ්‍රාම යන්න ඉල්លුවා.එයාට පවරලා තියෙන්නේ හිඟ වෙච්ච ආදායම් බදු ලබාගන්න ක්‍රියා කරන එක.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

හැබැයි මේ ක්‍රියාවලිය දැන් වෙනකොට නතර වෙලා තියෙනවා.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

මතුගම ඒ දුර්වලකම තිබුණා.මොකද ඒක එයාට කරන්න බැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුරේෂ් දර්ශන ජයසේකර මහතා**

එතකොට දැන්වීම් පුවරු සම්බන්ධයෙන් ස්ටිකරයකට මුදල් අනුමැතියට දාලා තිබුණා.ඒ ක්‍රියාවලිය සිදු වෙලා නැහැ.ස්ටිකර් එක ගෙනාවට අලවලා නැහැ.මේ ක්‍රියාවලියට මාස දෙකක් තුනක් වෙනවා. නමුත් කෙරිලා නැහැ. ලේකම්තුමිය මේ කාරණා ද්විත්වය පිළිබඳවත් අඩුම තරමේ සොයා බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී රුවන්දි ත්‍රිමාන්න මහත්මිය**

තඹරුටිය පෙර පාසලේ අඩුපාඩු කිහිපයක් පිළිබඳව මම දැනුවත් කළා.මාස කිහිපයක් වෙනවා ඒ ඉල්ලීම් කරලා.මේ වාර්තාවේ තියෙනවා නමවෙනි මාසේ විසි නම වන දා තමයි තඹරුටිය පෙර

පාසලේ වැසිකිලිය සඳහා වැසිකිලි පෝච්චියක් මිලදී ගෙන තියෙන්නේ.අද වෙනකනුත් සවි කරලා නැහැ.ඒ තියෙන එක කැඩිලා.මේ සම්බන්ධයෙන් මීට පෙරත් කතා කළා.ඊට පසුව දැල් කැඩිලා තියෙනවා.පොඩි ළමයි අත් තුවාල කර ගන්නවා.ළමයි අත් තුවාල කර ගත්තාම දෙමාපියන් චෝදනා කරන්නේ අපිට.තඹරුටිය ප්‍රජාශාලාව තමයි පෙර පාසලට අරන් තියෙන්නේ.දැන් අර මිනිස්සුන්ට ප්‍රජා ශාලාවත් නැහැ.පෙර පාසලත් හරියට නැහැ.එක්කෝ පෙර පාසල හරියට හදන්න ඕන.නැතිනම් ගමේ මිනිස්සුන්ට ප්‍රජා ශාලාවක් දෙන්න ඕනා. වෙන පෙර පාසල් අලුතින් ආරම්භ කරනවා.නමුත් මේ පෙර පාසලේ අඩුපාඩු ටික හැදෙන්නේ නැහැ.මේකේ ළමුන් විශාල ප්‍රමාණයක් ඉන්නවා.මේ පිළිබඳව අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සාරානන්ද මාවතේ ප්‍රාදේශීය සභාවට අයත් එගොඩ නාරවිල මාර්ගයේ පාලම ප්‍රයෝජනයක් ගන්න බැරි මට්ටමේ තියෙන්නේ. ප්‍රයෝජනයක් ගන්න පුළුවන් වුණත් වල් බිහිවෙලා තියෙන්නේ.ඒ පැරණි යකඩ පාලම වෙනුවට අලුත් පාලමක් සවි කළා.මේ පාලමට ටෙන්ඩරයක් කැඳවලා මුදලක් ලබාගන්න. මොකද සභාවට අයිති පාරක සභාවට අයිති පාලමක් මේක.ඒ පිළිබඳව සොයා බලන්න.

**ගරු සභාපති මෙරිල් මුණසිංහ මහතා**

අර වෙන්දේසියට දාපු ටයර් ටික මන්ත්‍රීතුමාලා බැලුවේ නැහැ නේද?වෙන්දේසියට දාලා තියෙන්නේ.අද පුළුවන්නම් බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මද්දගේ හින්ටන් ගුණසිරි මහතා**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා නගපු චෝදනාවක් පිළිබඳ ව මම කථා කරන්නේ.රක්ෂණ නියෝජිත මහතා විසින් එතුමාට තර්ජනය කිරීමක් පිළිබඳව එතුමා සඳහන් කළා.ඇත්තටම තර්ජනය කළාට පසුවයි අපි දන්නේ කවුද ඒ නියෝජිතයා කියලා. අවුරුදු දහයක් දොළහක් ඉඳලා මේ නියෝජිතයා මේ රක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියා කරලා තියෙනවා.ඔහුට එම අවස්ථාව නොලැබීම නිසා වෙන්නැති තර්ජනය කළේ.එතුමා දන්නැතුව ඇති මේ කවුද කියලා. එතුමා සද්භාවයෙන් සභාව වෙනුවෙනුයි ක්‍රියාත්මක වුණේ.එතුමාට වෙන අසාධාරණය අපි දන්නේ නැහැ.අපි සභාවක් හැටියට ගන්න තීරණය ක්‍රියාත්මක කරමු.ඒ වගේම එතුමා තර්ජනය කළා නම් සභාවක් වශයෙන් අපි ඒකට විරෝධය දක්වන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුජීව නිර්මාණ මහතා**

ඇත්තෙන්ම මට දෙදිනක් ම විශාල චෝදනාවක් කළා,"මේ ඉන්නේ අපේ බඩට ගහන මන්ත්‍රීතුමා" කියලා.මම ඒ වෙලාවෙදි කිව්වා,"ඇත්තෙන්ම මම හොරකමට සහ වංචා දූෂණවලට විරුද්ධයි.ඒ වෙනුවෙන් අවශ්‍ය ඕනෑම මොහොතක පෙනී සිටිනවා" කියලා.නැවත වතාවක් කිව්වා "මට ඊළඟ පාර ඡන්දය ඉල්ලන්න දෙන්නේ නැහැ,මාව පරද්දනවා කියලා".මම ඇත්තෙන්ම කනගාටු වෙනවා මේ සභාව වෙනුවෙන් කතා කරලා සිදුවුණු තර්ජනය සම්බන්ධයෙන්.මම දන්නේ නැහැ මේ පුද්ගලයා පිළිබඳ ව.2019 ඉඳන් රක්ෂණයට වැය කළ මුදල වැඩි බව මම කිව්වා.රක්ෂණ අලෙවි නියෝජිතයෙක් හරහා මේ ක්‍රියාවලිය සිදුවන බව දන්නේ ටෙන්ඩර් කැඳවූ පසුවයි.වාර්ෂිකව ලක්ෂ 11ක පමණ මුදලක් වැය කරලා තියෙනවා.

සණසෙන් ලක්ෂ 3යි ගාණකට මේක රක්ෂණය කරන්න ඇවිත් තියෙන්නේ.අපි ප්‍රතිලාභ බැලුවොත් පසුගිය අවුරුදු පහටම අරන් තියෙන්නේ.2017 - වාහන 2,2018- වාහන 2,2019- වාහන 3,2020- වාහන 2,2020- වාහන 2 යි.මේකෙන් අවස්ථා පහකදී සභාපතිතුමාගේ වාහනයට ප්‍රතිලාභ අරන් තියෙනවා.ලේකම්තුමියගේ වාහනයට අවස්ථා දෙකක් අරන් තියෙනවා.තව වාහන දෙකයි,ත්‍රීවිල් දෙකකටයි ඒ කියන්නේ මුළු වාහන 11 යි ප්‍රතිලාභ අරගෙන තියෙන්නේ.

ඒ වගේ ම රක්ෂණය වෙනුවෙන් 2017 වර්ෂයේ දී රු.අටලක්ෂ දහදාහක්,2018 වර්ෂයේ දී රු.නමලක්ෂ පනස්අටදාහක්,2019 වර්ෂයේ දී රු.එකොළොස් ලක්ෂ අනූදෙදාහක්,2020 දි රු.එකොළොස් ලක්ෂ පනස්හයදාහක්,2021දි රු.එකොළොස් ලක්ෂ හත්දාහක් ගිහින් තියෙනවා.ඉතින් රු.ලක්ෂ 3කට ලක්ෂ 5-6,ක් ම සභාවට ඉතිරි වෙනවා.ඒ නිසා මේ රක්ෂණ ආයතනයෙන් ඉවත් කරලා සාධාරණ අඩු මුදලකට සභාවට වාර්ෂික ව ලක්ෂ පහ හයක් ඉතිරි කරගන්න.ඒ වෙනුවෙන් තමයි මට තර්ජනය කළේ. මම දේශපාලනය කළත් නොකළත් සමාජයේ යහපත වෙනුවෙන් පෙනී සිටිනවා.සභාවේ අවධානය මේ වෙනුවෙන් යොදවන්න.ඒ වෙලාවෙත් ඒ රක්ෂණ නියෝජිතයා මේ සභාවේ නිලධාරීන් පිළිබඳව වැරදි අර්ථකථනයක් කළා.ඒවා නොඅසන්න සාධාරණ ක්‍රමවේදයකට සභාවේ මුදල් භාවිත කරන්න.

**ගරු උප සභාපති ලලිත් රණසිංහ මහතා**

රක්ෂණය වෙනුවෙන් අපිත් විරුද්ධ වුණා. මොකද ඒක නීත්‍යානුකූල ක්‍රමවේදයකට නෙමෙයි සිදු කරලා තිබුණේ.ඒ වගේම මම මේ සභාව දැනුවත් කරනවා,මගේ නෝනා සමහර වෙලාවට ආර්.ඩී.රණසිංහ කියලා භාවිත කරනවා.එහෙම භාවිත කරන්න පුළුවන්.ඒක භාවිත කරන්නේ අද ඊයෙක ඉඳලා නෙමෙයි ගොඩාක් කල් ඉඳලා.අපි කොරෝනා වසංගතයෙන් කිසි දෙයක් ලබා ගත්තේ නැහැ.

න්‍යාය පත්‍රානුකූල ව මෙදිනට නියමිත කටයුතු අවසන් වීමෙන් පසු ව මහ සභාවේ කටයුතු ප.ව.01.00ට පමණ අවසන් විය.